**unit 03**

වාගීෂ්වර

# රාජ්‍යයේ ස්වභාවය

3.1 රාජ්‍යයේ සංයුතික මූලධර්ම

3.2 රාජ්‍යයේ ආරම්භය හා විකාශනය

sureka wageeshwara

# රාජ්‍යය (STATE)

■ රාජ්‍යය , නම් වූ භාෂාමය වාග් සංකේතය නිර්මාණය වීමට අදාළ ඓතිහාසික විකාශනය

ග්‍රීකයේ "පොලිස්" (Polis) වාග් සංකේතය භාවිතය රාජ්‍යයට අදාලව හමුවන ඓතිහාසික පදයකි. පොලිස් යන්නෙහි සංකේතික අරුත "නගර පාලනය" යන්න යි. මෙහිදී ඉපැරණි ග්‍රීසිය තුළ පැවති නාගරික (පෞර) රාජ්‍යය ක්‍රමය මත පදනම් වී Polis යන වාග් සංකේතය ව්‍යවහාරයට පැමිණ තිබේ.

උදා : ඇතැන්ස් , ස්පාටා , කොරින්ත් , තීබීස් , ග්ලෝරි , අකේඩිය , රෝමය

රෝමය තුළ "සිවිටාස්" ( Civitas) යන පදය රාජ්‍යයට අදාලව භාවිත වාග් සංකේතය ලෙස ඉදිරිපත් කළ හැකිය. සිවිටාස් යන්නෙහි සංකේතය අරුත "පුරවැසි සබඳතා සහ පුරවැසි එකතුව " යන්න යි.

නිකලොයි මැකියාවේලි ගේ (කුමාරයා - The Prince - 1513) කෘතිය තුළ දී සිදු වූ වාක් සංකේතික භාවිතාවන් හරහා "රාජ්‍යය" (State) යන පදය දේශපාලන විද්‍යා ව්‍යවහාරික ශබ්ද කෝෂයට එකතු වේ.

චර්යාවාදීන් , "දේශපාලන ක්‍රමය" ( Polity ) යන පදය රාජ්‍යයට අදාලව භාවිතා කිරීමට උත්සාහ ගෙන ඇතිමුත් එය එතරම් ජනප්‍රිය වූවක් නොවේ.

■ නූතන ජාතික රාජ්‍යයක "ලක්ෂණ" (සංයුතික මූලධර්ම) මත පදනම් වී රාජ්‍යය හඳුනා ගැනීම.

- භූමිය (Territory)
- ජනගහනය (Population)

} ස්වභාවික සාධක / මූලික සාධක

- ආණ්ඩුව (Government)
- ස්වාධිපත්‍ය බලය (Sovereignty)

} ද්විතීක සාධක / කෘත්‍රිම සාධක

## භූමි ප්‍රදේශය (Territory)

හැඳින්වීම

රාජ්‍යයක් නිර්මාණය වීමට අදාළ "භෞතික පදනම" භූමිය විසින් සපුරාලනු ලැබේ. **භූමියට අදාල කොටස් 03 කි.**

1. ගොඩබිම
2. සාගර ප්‍රදේශය
3. අවකාශය

| | | |
|---|---|---|
| **ගොඩබිම** | - | දේශ සීමා අභ්‍යන්තරයේ ගොඩබිම් ප්‍රදේශය. |
| **සාගර ප්‍රදේශය** | - | ගොඩබිමේ සිට පැතිර ඇති සාගර ප්‍රදේශය මීට අයත් වෙයි. මුල් කාලීනව වෙරළේ සිට සැතපුම් 12 ක ව්‍යාප්තික සීමාවකින් යුක්ත වූ මෙය පසුකාලීනව සැතපුම් 200 ක් දක්වා වර්ධනය විය. |
| **අවකාශය** | - | සාගරය සහ ගොඩබිම වසා ඇති අහස් සීමාව මීට අදාළ වේ. |

නිර්වචන

නූතන ජාතික රාජ්‍යයක ලාක්ෂණිකයක් වන භූමිය රාජ්‍යයක් සතුව පැවතිය යුතු බව ලිඛිත වාර්තා ගතව මුල් වරට අවධාරණය කළේ 1817 දී ලීවර් නැමති දේශපාලන විචාරකයා විසිනි.

**ලීවර් - 1817 "නිශ්චිත දේශසීමා වලින් වට කරන ලද භූමි ප්‍රදේශයක් රාජ්‍යයක් ලෙස හැඳින්විය හැකිය."**

ඓතිහාසික පදනම

නූතන ජාතික රාජ්‍යයක ලාක්ෂණිකයක් වන භූමියට අදාළ ඓතිහාසික පදනම සොයා යාමේදී එය මූලික ප්‍රාථමික භෞතික ජෛව උරුමයක් නිසාවෙන් සියලුම රාජ්‍යයන් තුළ භූමිය නැමැති ලාක්ෂණිකය දියුණු සංකල්පීය විග්‍රහයකින් තොරව වුවද පැවතුනි. එනම් , "ගෝත්‍රික රාජ්‍යය" (Tribal State) අවධියේ පටන්ම අවකාශය - සාගරය වැනි ආංශික විග්‍රහයන් නොවූ නමුත් රාජ්‍ය හා බද්ධව භූමියක් පැවතින.

ප්‍රමාණය

භූමියේ ප්‍රමාණය හා සම්බන්ධ නිෂ්චිත ව්‍යාප්තික සීමාවක් නොමැති අතර එය අතිශය කුඩා භූමියක් හෝ අතිශය විශාල භූමියක් විය හැකිය. අවශ්‍ය වන්නේ නිශ්චිත වූ දේශ සීමාවන්ගෙන් වට වූ පැහැදිලිව හඳුනා ගත් ඒකාග්‍රතාවයක් සහිත භූමි ප්‍රදේශයක් පැවතීම පමණි.

| | | |
|---|---|---|
| උදා : | ලංකාවේ භූමි ප්‍රදේශය | ව : සැ : 25332 |
| | සිංගප්පූරුව | ව : සැ : 225 |
| | ඉතාලියේ (සැන්මැරිනෝ) | ව : සැ : 38 |
| | රුසියාව | ව : සැ : 2 200 000 |
| | ඇමරිකානු භූමිය ලෝක භූමියෙන් 1/19 ක ව්‍යාප්තවීම. | |

● භූමියේ ප්‍රමාණය හා බැඳුනු දාර්ශනික මත

**කුඩා භූමි ප්‍රදේශ හා බැඳුනු රාජ්‍ය ක්‍රමය**

ප්ලේටෝ , මොන්ටෙස්ක්‍යු හා රූසෝ ආදීහු කුඩා භූමි ප්‍රදේශයක් සහිත රාජ්‍යයන් අගය කර තිබේ. ඊට අදාල හේතු ,

1. පරිපාලන කටයුතු වඩාත් පහසු හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ හැකි වීම.
2. රාජ්‍යය ස්වයං පෝෂිත කිරීමට පහසු වීම.
3. ජාතික සමගිය පවත්වාගෙන යාමට පහසුවීම.

**මධ්‍යම ප්‍රමාණයේ භූමියක් හා බැඳුනු රාජ්‍යය ක්‍රමය**

ඇරිස්ටෝටල් අවධාරණය කළේ සියල්ලකදී මෙන් ම රාජ්‍යය හා බැඳුනු භූමියට ද මධ්‍යස්ථ ප්‍රමාණයක් පැවතිය යුතු බවයි. එය අතිශය විශාල හෝ කුඩා භූමියක් නොවිය යුතු බව ඇරිස්ටෝටල් වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය. ඊට **අදාළ හේතුව,**

1. රාජ්‍යය තුළ ජීවත් වන පුරවැසියන් එකිනෙකා හඳුනාගනිමින් මිතුරු සැබැඳියාවන් පැවැත්විය යුතුවීම.

**විශාල ප්‍රමාණයේ භූමියක් හා බැඳි රාජ්‍යය ක්‍රමය**

විශාල ප්‍රමාණයේ භූමිය හා බැඳි රාජ්‍යය ක්‍රමය නූතන ප්‍රවණතාවයක් ලෙස හඳුනා ගනු ලබන මුත් එය හා බැඳුනු සුවිශාල ඓතිහාසික පදනමක් වේ. ජීවීන් මතු භූමිය අත්පත් කර ගැනීමේ නොනිමි අසීමා ආශාව මත අතීත ඉතිහාසයේ පටන් මහා අධිරාජ්‍යයන් බිහි කිරීමේ ආශාව මේ තුරුම නොනිමාව පවතී.

උදා - රෝම අධිරාජ්‍යය.
ධර්මාශෝක අධිරාජ්‍යය.
මහා බ්‍රිතාන්‍යය එංගලන්තීය ඉංග්‍රීසි අධිරාජ්‍යය. (හිරු නොබසින අධිරාජ්‍යය)

විශාල රාජ්‍යයන් නිර්මාණය හා බැඳි **හේතු :**

1. ස්වභාවික සම්පත් සීමාව ව්‍යාප්ත කර ගැනීම.

2. විශාල ශ්‍රම බලකායක් තබා ගැනීමේ අවශ්‍යතාවය

3. රාජ්‍යයේ ආරක්ෂාවට යහපත්වීම.

● භූමිය හා බැඳි මනෝ භාවයන්

භූමිය ජීවීන් හා බැඳුණු අතිශය සමීපත සාධකයක් නිසාවෙන් භූමිය හා බද්ධව වර්ධනය වන විවිධ මනෝභාවයන් ද වේ.

උදා : මගේ රට , මව්බිම , අපේ රට , දේශාභිමානය , දේශානුරාගය , මාතෘ භූමිය.

මේවා දේශපාලනික වශයෙන් වැදගත් මනෝභාවයන් වන අතරම ඇතැම් විට අතිශය අහිතකර දේශපාලන අවභාවිතාවන්ට ද මෙම මනෝභාවයන් හේතු වේ.

## ජන සංඛ්‍යාව (Population )

හැඳින්වීම

රාජ්‍යය පිළිබඳ දේශපාලනික සංකල්පය බිහිවීමේ ස්වභාවික ප්‍රාථමික සාධක ද්විත්වය අතර දෙවන කොන්දේසිය ලෙසින් ජන සංඛ්‍යාව ඉදිරිපත් කළ හැකිය. රාජ්‍යය බිහිවීමට භූමියක් පැවතීම පමණක් කිසි ලෙසකින් ප්‍රමාණවත් නොවන අතර එම භූමිය ජනවාවාසවීම අනිවාර්ය්‍ය සාධකයකි.

රාජ්‍යයේ ජෛවී භාවය හෙවත් සජීවීතාව ජනතාව මත තීරණය වේ. රාජ්‍යය හා බැඳි ජනගහනය පිළිබඳව "ස්ටීවන් ලිකෝක්" ගේ ප්‍රකාශය,

**"මිහිපිට ජනාවාස නොවූ භූමියක් කිසිසේත්ම රාජ්‍යයක් ලෙස සැලකිය නොහැකිය"**
**-ස්ටීවන් ලී කෝක්-**

ප්‍රමාණය

රාජ්‍යය පිළිබඳ සංකල්පය බිහිවීමට ජනගහනය අත්‍යවශය අනිවාර්ය සාධකයක් මුත් එහි ප්‍රමාණය පිළිබඳව සීමාවක් ඉදිරිපත් කළ නොහැකි ය. ඇතැම් රාජ්‍යයක් තුළ ඉතා කුඩා ජනගහනයක සිටීමට හැකි අතරම තවත් රාජ්‍යයක අතිශය විශාල ජන සංඛ්‍යාවක් ජීවත් විය හැකිය. රාජ්‍යයක ජනගහනයට අදාළ කුඩා බව පිළිබඳ කථා කිරීමේදී එහි සීමාවක් නොමැති මුත් එම කුඩා ප්‍රමාණය මිනිසුන් 4ක , 5ක "කුඩා කුලකයක්" වීම නම් රාජ්‍යය බිහිවීමට අදාල සජීවී ජනගහනයට ප්‍රමාණවත් නොවේ. මෙහිදී ප්‍රකාශ කළ යුත්තේ ඉහත සඳහන් කුඩා ජනගහනය රාජ්‍යය පිළිබඳ සංකල්පය සජීවීභාවයට පත්වීමට අදාල සැලකිය යුතු ප්‍රමාණයට අදාල ජනගහනයක් විය යුතු බවයි.

උදා - වතිකානුව - (ලෝකයේ අඩුම ජනගහනය සහිත රාජ්‍යය) 2000
ඇන්ඩෝර් - 5000
මාලදිවයින - 300,000
ඉන්දියාව - කෝටි 100 කට අධික වීම.
චීනය - කෝටි 130 කට අධික වීම.

ඉහත දත්ත අනුව පැහැදිලි වන්නේ රාජ්‍යයක් බිහිවීමට අදාල සැලකිය යුතු සජීවී ජනගහනයක් හිඳී නම් එහි කුඩා බව හෝ සුවිශාල බව රාජ්‍යය පිළිබඳ සංකල්පයට කිසිඳු බාධාවක් නොවන බවයි.

● ජනගහණයේ ප්‍රමාණය සම්බන්ධයෙන් දාර්ශනික මත

ප්ලේටෝ - ප්ලේටෝ දක්වන්නේ ග්‍රීක පෞර රාජ්‍යවල ජනගහනය 5000 ක් පමණ සිටීම ප්‍රමාණවත් බවයි. පාලන කටයුතු පහසුවීම ඊට හේතුව යි.

රූසෝ - රූසෝ ප්‍රකාශ කරනු ලබන්නේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය හොඳින් ක්‍රියාත්මක කිරීමට 10,000 ක පමණ ජනතාවක් සිටීම යෝග්‍ය බවයි.

ජනගහන සීමාවන්

භූමියක සිටිය යුතු ජනගහනය සම්බන්ධ සංවාදය තුළදී ජනහනයේ වාර්ගික හා වාර්ණික සීමාවන් පිළිබඳව ද සීමාවක් දැක්විය නොහැකිය. එනම් බහු වාර්ණික හා බහු වාර්ගික පදනමක් සහිතව රජ්‍යයේ ජනගහනය නිර්මාණය විය හැකිය.

උදා : ශ්‍රී ලංකාව - සිංහල / ද්‍රවිඩ / මුස්ලිම් / බර්ගර් බහු වාර්ගික රාජ්‍යය කි.

ඉන්දියාව - හින්දු / දෙමළ / තෙළිඟු /මළයාල භාෂා බොහෝමයක් සහිත රාජ්‍යය කි.

ඇමරිකාව - කලු / සුදු /කහ බහු වාර්ණික මිශ්‍ර රාජ්‍යය කි.

● ජනගහණය හා බැඳි මනෝ භාවයන්

ජනගහනය හා බැඳි මනෝභාවයන් ද හඳුනාගත හැකි ය. ජාත්‍යාලය , ජාතිකානුරාගය , ශ්‍රේෂ්ඨ ජාතිය මීට අදාළව සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශනයන් ය. මේවා දේශපාලනික වශයෙන් වැදගත් මෙන්ම අතිශයින්ම අහිතකර දේශපාලන අවභාවිතාවයන්ට භාවිතා කළ හැකි මනෝභාවයන් ය.

■ **ජනගහනයේ ප්‍රමාණය සම්බන්ධ වාසි අවාසි**

1. විශාල ජනගහණයක් සිටීමේ වාසි (වැදගත් බව)

★ **ආර්ථිකමය වාසි**

(i) විශාල ශ්‍රම බලකායක් සතුවීම මගින් ආර්ථිකව ඇතිවන වාසි.

(ii) ශ්‍රම සූක්ෂම කර්මාන්ත බිහිකළ හැකිවීම.

(iii) ශ්‍රමය සාපේක්ෂව සහනදායී මිලකට ලබාගත හැකි නිසාවෙන් නිශ්පාදන පිරිවැය අඩුවීම ලෝක වෙළඳපොල ජයගත හැකිවීම.

(iv) විශාල පාරිභෝගික සංඛ්‍යාවක් (වෙළෙඳ පොලක්) ස්වකීය රාජ්‍යය තුලම පැවතීම නිසා ජාතික රාජ්‍යය තුළ සිදු කරන නිෂ්පාදනයන් තම ජාතික රාජ්‍යය තුළම විශාල පාරිභෝගික පිරිසක් වෙත අලෙවි කිරීම හරහා ලාබ උපරිම කරගත හැකිවීම.
උදා : ඉන්දියානු සිනමාව

(v) ජාත්‍යන්තර වෙළෙඳපොල මත යැපෙමින් විදේශ විනිමය අවධානමකට මුහුණ දීමට අවශ්‍ය නොවීම.

★ **ආරක්ෂාව සම්බන්ධ වාසි**

(i) විශාල යුධ හමුදාවක් පවත්වා ගැනීම තුළ අත්පත් වන වාසි.

(ii) අන්තර්ජාතික වශයෙන් තම ජාතික රාජ්‍යයේ බලය ප්‍රදර්ශනය කළ හැකි වීම.
උදා - චීනය , ඉන්දියාව , ඇමරිකාව

2. විශාල ජනගහණයක් සිටීමේ අවාසි (අවැදගත් බව)

★ **ආර්ථිකමය අවාසි**

(i) විශාල ජනගහනයකට අදාළ ආර්ථිකමය තීන්දු තීරණ ගැනීම සහ වැඩසටහනක් සැකසීමේදී ප්‍රායෝගිකව ඇතිවන අපහසුතා බොහෝ ය.

(ii) විරැකියාව උග්‍ර විය හැකිය. (ශ්‍රම සූක්ෂම කර්මාන්ත වෙනුවට තාක්ෂණ සූක්ෂම කර්මාන්ත හමු වේ.)

(iii) ශ්‍රම සූරාකෑම වැනි තත්ත්වයක් නිර්මාණය වීමට ඇති ඉඩකඩ.

උදා : ලොව පුරා ක්‍රියාත්මකව ඇති ඇගලුම් කර්මාන්ත ක්‍රමය.
ඉන්දියාව - පාකිස්ථානය වැනි රටවල ළමා ශ්‍රමය කාන්තා ශ්‍රමය වැනි ගැඹුරු ප්‍රශ්න

★ **<u>සාමාජීය වශයෙන් ඇතිවන අවාසි</u>**

(i) සාක්ෂරතාව නොමැතිවීම.
(ii) අඩු අධ්‍යාපනය
(iii) සමාජ රෝග
(iv) ළමාරෝග, ළමා මරණ ,මාතෘ මරණ, මන්දපෝෂණය ආදී සෞඛ්‍යමය ගැටලු
(v) ළමා අපයෝජන සහ ළමා අපචාර

★ **ආරක්ෂාව සම්බන්ධ අවාසි**

විශාල ජනගහනය හමුවේ ජාතික රාජ්‍යය තුළ ආරක්ෂාව සම්බන්ධ විවිධ ගැටලු ඉස්මතු විය හැකිය. ජනගහනය අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සමගිය පවත්වා ගැනීමේ අපහසුතා , (බහු වාර්ගික බහු වාර්ණික සහ බහු ආගමික රාජ්‍ය තුළ ඔවුනොවුන් අතර සමගිය හා අවබෝධය පවත්වා ගැනීම ප්‍රායෝගිකව ඉතා වෙහෙස කර එකකි.)

උදා - ඉන්දියාව (ඉන්දියාව තුළ පවතින ආගමික හා භාෂාමය සටන්)
ලංකාව (සිංහල මුස්ලිම් ගැටුම 1915 -සිංහල දමිළ ප්‍රශ්නය)
ඇමරිකාව (කලු / සුදු වර්ණවාදී ප්‍රශ්නය)

## ප්‍රාථමික, මූලික (ස්වාභාවික සාධකයන්) වන භූමිය, ජනගහනය අතර පවතින්නා වූ සබැඳියාව

- <u>ජනගහනය</u> නොමැති භූමිය රාජ්‍යයක් නොවේ.
  උදා : ඇන්ටාටිකාව / උතුරු ආර්ක්ටික් ප්‍රදේශයේ ඇති දූපත්
- <u>නිශ්චිත භූමි</u> ප්‍රදේශයක් නොමැති ජනගහනය ද රාජ්‍යයක් නොවේ.
  උදා : ලෝකයේ දුවිඩ ප්‍රජාව

මීට පෙර යුදෙව්වන් ද රාජ්‍යයක් නොමැති ප්‍රජාවක්ව හිඳි මුත් 1948 වර්ෂයේ දී **"පලස්තීන භූමිය"** ඇමරිකානු ආධාර සහිතව ආක්‍රමණය කළ යුදෙව්වන් **"ඊශ්‍රායලය"** නම් යුදෙව් රාජ්‍යය බිහිකර ගනී.

## ආණ්ඩුව (Government)

හැඳින්වීම

ආණ්ඩුව යනු රාජ්‍යය පිළිබඳ සංකල්පයේ බිහිවීමට අදාල ද්විතියික සාධකයකි. එය නිර්මාණය කරගන්නා ලද සාධකයකි. ආණ්ඩුව විවිධ ස්වරූපයෙන් දේශපාලන විද්‍යා ලිඛිත සාහිත්‍යයමය මූලාශ්‍ර වල විවරණය වේ. <u>රාජ්‍යයේ ක්‍රියාකාරී අංශය වේ. රාජ්‍යයේ සංවිධානාත්මක අංශය වේ. රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය වේ. රාජ්‍යයේ ක්‍රියාකාරී මෙවලම වේ. රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කරමින් ජනතාව පොදු අරමුණ කරා මෙහෙයවන්නා ද වේ.</u>

**ආණ්ඩුව සම්බන්ධව ඉදිරිපත්ව ඇති <u>දාර්ශනික නිර්වචන</u>**

| | | |
|---|---|---|
| ගානර් | - | "රාජ්‍යයේ හෝ මහජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්ති වලට හැරවීමත් ක්‍රියාවට නැගීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ." |
| ලැස්කි | - | "ආණ්ඩුව පවතින්නේ රාජ්‍ය අරමුණු ක්‍රියාවට නැගීමට වේ." |

**ආණ්ඩුවේ ත්‍රිවිධ අංශ**

ව්‍යවස්ථාදායකය (Legislatures)
විධායකය (Executive
අධිකරණය (Judicial)

### <u>ව්‍යවස්ථාදායකය (Legislatures)</u>

ව්‍යවස්ථාදායකය යනු ආණ්ඩුවට අවශ්‍යය නීති සම්පාදන කෘත්‍යයේ නියැලෙන ආයතනය වේ. එක් එක් ජාතික රාජ්‍යය තුළ ක්‍රියාත්මක ව්‍යවස්ථාදායක ආයතනයන්ට විවිධ නාමකරණයන් වන අතර බොහෝ රටවල එය <u>පාර්ලිමේන්තුව (Parliment )</u> ලෙස හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව ඊට අදාල නිදර්ශනයකි. එමෙන්ම විවිධ රටවල ව්‍යවස්ථාදායකය ඒ හැර වෙනත් නම් වලින් ද නාමකරණය වී තිබේ.

උදා - ඇමරිකාව - කොංග්‍රස් මණ්ඩලය / රුසියාව - ඩූමාව

### <u>විධායකය (Executive)</u>

ව්‍යවස්ථාදායක ආයතනය විසින් සම්පාදිත නීති ක්‍රියාවට නැංවීමේ කාර්යය විධායකය විසින් සිදුකරයි. එමෙන්ම ප්‍රායෝගික භාවිතය තුළ ආණ්ඩුව බවට පත් වන්නේ විධායකය යි. <u>විධායකය ද රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් හැඩතල දරයි.</u>

උදා -

| | | |
|---|---|---|
| ජනාධිපති විසින් විධායක කටයුතු කිරීම | - | ඇමරිකාව |
| කැබිනට් මණ්ඩලය විසින් විධායක කටයුතු කිරීම | - | බ්‍රිතාන්‍යය |
| මිශ්‍ර විධායකය | - | ලංකාව |
| රජු | - | ඕමානය |
| හමුදාව | - | මියන්මාරය |

## <u>අධිකරණය (Judicial)</u>

ව්‍යවස්ථාදායකය විසින් සම්පාදනය කොට විධායකය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීති විනිශ්චය කරනු ලබන්නේ අධිකරණය යි. නීති උල්ලංඝණය කරන්නේ නම් දඬුවම් පමුණුවන්නේ ද අධිකරණය විසිනි. අධිකරණය ද විවිධ ජාතික රාජ්‍යයන් තුළ විවිධ හැඩතල සහිතව ව්‍යාප්තව ඇත.

උදා : ශ්‍රේෂ්ඨාධිකරණය
අභියාචනාධිකරණය
මහාධිකරණය
දිසා අධිකරණය

විවිධ ආණ්ඩුවර්ග

රාජ්‍යය පිළිබඳ සංකල්පය බිහිවීමට අදාළව ආණ්ඩුව අනිවාර්යය සාධකයක් වුව ද සෑම ජාතික රාජ්‍යයක් තුළම පවත්නා වූ ආණ්ඩු සමරූපී වියයුතු බවට මතයක් නොමැත. අවශ්‍ය වන්නේ ආණ්ඩුවක් පැවතීම පමණි. එහි ස්වරූපය පිළිබඳ සීමාවක් නොමැත. **විධායකයේ ස්වරූපය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදාහැර ඇති ආකාරය මත , දේශපාලන න්‍යාය මත විවිධ ආණ්ඩු වර්ග හඳුනාගත හැකිය.**

- **විධායකයේ ස්වරූපය මත**

| | | |
|---|---|---|
| ජනාධිපති ආණ්ඩුක්‍රම | - | ඇමරිකාව |
| කැබිනට් ආණ්ඩුක්‍රම | - | බ්‍රිතාන්‍යය |
| මිශ්‍ර ආණ්ඩුක්‍රම | - | ලංකාව |
| රාජාණ්ඩුක්‍රම | - | ඕමානය |
| හමුදා ආණ්ඩුක්‍රම | - | මියන්මාරය |

- **දේශපාලන න්‍යාය මත**

| | | |
|---|---|---|
| ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු | - | බ්‍රිතාන්‍ය |
| සමාජවාදී ආණ්ඩු | - | රුසියාව / චීනය |

- **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත**

| | | |
|---|---|---|
| ඒකීය ආණ්ඩු | - | බ්‍රිතාන්‍යය |
| සන්ධීය ආණ්ඩු | - | ඉන්දියාව |

ආණ්ඩුවේ අත්‍යාවශ්‍ය භාවය

භූමිය හා ජනසංඛ්‍යාව යන ප්‍රාථමික කොන්දේසි සපුරාගන්නා මුත් සංකල්පීයව රාජ්‍යයක් බිහි නොවේ. "<u>ආණ්ඩුවේ අධිකාරිය</u>" රාජ්‍යය බිහිවීමට අනිවාර්‍ය්‍ය සාධකයකි. යම් භූමියක් තුළ ආණ්ඩු පාලනයට හසු නොවන ජනතාවක් වාසය කරන්නේ නම් එය රාජ්‍යයක් ලෙස සැලකිය නොහැක. ඒ මන්ද යත් එවැනි තත්ත්වයක් කිසිඳු පාලනයකට යටත් නොවූ "<u>අනධිකාරී</u>" තත්ත්වයක් වන බැවිනි. එම නිසා ආණ්ඩුවක පැවැත්ම අනිවාර්‍ය්‍ය අවශ්‍යතාවයක් වේ.

## ස්වාධිපති බලය (Sovereignty)

හැඳින්වීම

රාජ්‍යය බිහිවීමට අදාළ ද්විතීක සාධකයක් ලෙසින් හඳුනා ගන්නා ස්වාධිපත්‍යය රාජ්‍යයක පැවැත්ම සඳහා අනිවාර්යය වූ සාධකයක් බවට පත් වේ. සරලව කිවහොත් ස්වාධිපත්‍ය යනු රාජ්‍ය සතු බලය යි. ස්වාධිපත්‍ය නැවත සරලවම විවරණය කරනුයේ නම් ඉන් අදහස් වන්නේ රාජ්‍යයට කිසිඳු අභ්‍යන්තර හෝ බාහිර බලපෑමකින් තොරව ව්‍යවස්ථාදායක විධායක සහ අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට ඇති බලය වේ.

ස්වාධිපති බලයට අදාළ විවිධ දේශපාලන විද්‍යා සාහිත්‍යමය විවරණයන්

"ස්වාධිපත්‍ය පරම බලය වේ."
"ස්වාධිපත්‍ය අසහාය බලය වේ."
"ස්වාධිපත්‍ය උත්තරීතර බලය වේ."
"රාජ්‍යයේ ජීවනාලය හා ආත්මය ලෙසින් ස්වාධිපත්‍ය බලය හැඳින්වේ."

රාජ්‍යයක ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නගන උපකරණ

හමුදාව / පොලීසිය / අධිකරණය / බන්ධනාගාරය / පෝරකය / එල්ලුම්ගහ

නූතන ජාතික රාජ්‍ය වඩාත් සුවිශේෂී එකක් වන්නේ එය සතු ස්වාධිපත්‍ය බලය නිසාවෙනි. සරලව කිවහොත් නූතන ජාතික රාජ්‍යයන් සතු බොහෝ අද්වතීය පරම හැකියාවන් එයට උරුම වී ඇත්තේ ස්වාධිපත්‍ය මගිනි. දේශපාලන විද්‍යාව ලිඛිත සාහිත්‍යමය මූලාශ්‍ර තුළ හමුවන අපූර්ව ප්‍රකාශනය ඊට නිදර්ශන වේ.

**"මැණියන්ට ස්වකීය දරුවා ඝාතනය කළ නොහැකි මුත් රාජ්‍යයට එය කළ හැක්කේ ස්වාධිපත්‍ය බලය නිසාවෙනි."**

ඉතිහාසය

ජීන් බෝඩෑන් නම් ප්‍රංශ දාර්ශනිකයාට ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පය ලොවට ඉදිරිපත් කිරීමේ ගෞරවය උරුම වේ. ක්‍රි.ව 1576 දී **"රාජ්‍ය පිළිබඳ සම්මුතීන් හයක්"** යන කෘතිය තුළින් ස්වාධිපති වාදය දේශපාලන විද්‍යාවට මුල්වරට ඉදිරිපත් විය. ජීන් බොඩෑන් ස්වාධිපත්‍ය නිර්වචනය කරන්නේ මෙසේ ය.

**"කිසිඳු නීතියකින් සීමා නොවුණු යටත් වැසියන් කෙරෙහි යෙදවිය හැකි රාජ්‍යය සතු උත්තරීතර හා ශ්‍රේෂ්ඨ බලය ස්වාධිපත්‍ය නම් වේ."**

**-ජීන් බොඩෑන්-**

■ රාජ්‍ය සතු ස්වාධිපත්‍ය බලය කොටස් දෙකකට වර්ග කළ හැකිය.

01. අභ්‍යන්තර ස්වාධිපත්‍ය
02. බාහිර ස්වාධිපත්‍ය

## 01. අභ්‍යන්තර ස්වාධිපත්‍ය (Internal Soverignitoy )

අභ්‍යන්තර ස්වාධිපත්‍ය යනු රාජ්‍යයක සීමා අභ්‍යන්තරය තුළ ක්‍රියාත්මක අද්වතීය වූ උත්තරීතර බලය වේ. නැතහොත් රාජ්‍යයක දේශ සීමා අභ්‍යන්තරය තුළ බලපවත්නා වූ අවසාන ස්වාධීන අධිකාරිය ( Iltimate Independent Authority ) ස්වාධිපත්‍ය නම් වේ.

තවදුරටත් ,

රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන කිසිඳු පුද්ගල හෝ පුද්ගල කණ්ඩායමක බලපෑමකින් තොරව නිදහසේ ස්වාධීන පදනමක් මත ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ යන ත්‍රිවිධ අංශයන් ක්‍රියාවට නැගීමට රාජ්‍ය සතු හැකියාව අභ්‍යන්තර ස්වාධිපත්‍ය බලය නම් වේ.

අභ්‍යන්තර ස්වාධිපත්‍යට අදාලව ක්‍රියාත්මක වන බාධාවන් කිහිපයකි. නිදර්ශන ලෙස ,

| | |
|---|---|
| පාතාල ලෝකය | වෘත්තීය සමිති ව්‍යාපාර |
| කැරලි කෝලාහල | ත්‍රස්තවාදය |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් | ආගමික සංවිධාන |

## 02. බාහිර ස්වාධිපත්‍ය (External Soverignitoy )

රාජ්‍යයට ජාත්‍යන්තර පද්ධතිය තුළදී හිමි වන ස්ථානය බාහිර ස්වාධිපත්‍ය තුළ අවධාරණයට ලක් වේ. අන්තර් රාජ්‍ය සම්බන්ධතාවයන් පැවැත්වීමේදී රාජ්‍යයක් විසින් භුක්ති විඳින ශක්තිය හා ස්වාධීනත්වය මින් අවධාරණය වේ. කිසියම් රාජ්‍යයකට බාහිර , අන්තර්ජාතික බලපෑමකින් තොරව තම රාජ්‍ය තුළ ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට ඇති පරම අසහාය බලය බාහිර ස්වාධිපත්‍ය ලෙස විග්‍රහ කළ හැකි ය.

අභ්‍යන්තර ස්වාධිපත්‍යට අදාලව ක්‍රියාත්මක වන බාධාවන් කිහිපයකි. නිදර්ශන ලෙස ,

| | |
|---|---|
| කලාපීය බලවතුන්ගේ මැදිහත්වීම. | ලෝක බලවතුන්ගේ මැදිහත්වීම. |
| අන්තර්ජාතික සංවිධාන වල මැදිහත්වීම. | ආර්ථික සම්බාධක |
| අන්තර්ජාතික නීතිය | |

රාජ්‍ය පිලිබඳ සංකල්ප බිහිවීමට අදාළ මූලික ප්‍රාථමික කොන්දේසීන් වන භූමිය , ජන සංඛ්‍යාව සපුරාලීමෙන් අනතුරුව ආණ්ඩුවක් බිහි වූව ද එය රාජ්‍යයක් බවට පත් නොවේ. මක් නිසාද යත් ස්වාධිපත්‍ය රාජ්‍ය බිහිවීමට අදාළ අනිවාර්‍යය කොන්දේසිය වන නිසාවෙනි. ස්වාධිපත්‍ය නොමැති තැනකදී නිර්මාණය වන්නේ රටක් මිස රාජ්‍යයක් නොවේ.

## අන්තර්ජාතික පිළිගැනීම.

රාජ්‍යය සතු අන්තර්ජාතික පිළිගැනීම ද රාජ්‍යය බිහිවීමට අදාළ කොන්දේසියක් ලෙසින් 1933 මොන්ට් වීඩියෝ සම්මුතිය (montevideyo convention) මගින් දක්වා තිබේ.

■ **රාජ්‍යය යනු කුමක්දැයි හඳුනාගැනීමට භාවිතා කළ හැකි <u>දාර්ශනික නිර්වචන</u>**

- ඇරිස්ටෝටල්

"ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජිවිතයක් ගත කිරීමේ අරමුණෙන් මිනිසුන් එකට එකතු වී පිහිටුවා ගත් සංවිධානය රාජ්‍ය නම් වේ."

- සිසරෝ

"නීතිගරුක භාවය තුළින් පොදු සමාජ යහපත ළඟා කර ගැනීම සඳහා එකට එකතු වූ මිනිස් සමාජය රාජ්‍යය නම් වේ."

- වුඩ්රෝ විල්සන්

"නිශ්චිත දේශ සීමාවක් තුළ නීතිය සඳහා සංවිධානය වූ ජනතාව රාජ්‍යය ලෙස කෙටියෙන් හැඳින්විය හැකිය."

- ගානර්

"යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් ස්ථාවර වාස භූමිය කරගත් සංඛ්‍යාත්මක වශයෙන් අඩු හෝ වැඩි යම් ජන සංඛ්‍යාවකගෙන් සමන්විත ජනතාවගේ බහුතර අනුමැතිය ලබන්නා වූ සංවිධානාත්මක ආණ්ඩුවක් සහිත බාහිර වශයෙන් ස්වාධීන නැතිනම් වෙනත් පාලනයකට යටත් නොවූ මිනිස් සමාජය රාජ්‍යය වශයෙන් හැඳින්විය හැකිය."

- මාක්ස්

"තුලනය කළ නොහැකි ප්‍රතිවිරෝධතා සහිත සූරා කනු ලබන සහ සූරා කෑමට ලක් වූ වශයෙන් ප්‍රතිවිරුද්ධ පන්ති දෙකකට සමාජය බෙදී ගිය විට රාජ්‍යය පැන නගී සමාජයේ දේපල හිමි ධනපති පන්තිය විසින් නිර්දන පන්තිය සූරා කෑම සඳහාත් පාලනය කිරීම සඳහාත් ගොඩනගා ඇති සංවිධානය රාජ්‍යය වේ. රාජ්‍යය සතු ප්‍රජා පීඩක බලය ක්‍රියාවට නැංවෙන්නේ පොලීසිය හමුදාව උසාවිය සහ බන්ධනාගාර වැනි උපකරණ මාර්ගයෙනි"

- මැක් අයිවර්

"බාහිර පැවැත්ම හා සම්බන්ධ කොන්දේසි ජාත්‍යන්තර පදනමක් මත නිශ්චිතව දක්වන ලද පැහැදිලි දේශ සීමාවන් මගින් වෙන් කරන ලද ආණ්ඩු මගින් පනවනු ලබන නීති පදනම් කරගෙන අභ්‍යන්තර සමාජය තුළ අධිකාරී බලය පවත්වාගෙන යන මිනිස් සමාජය රාජ්‍යය වශයෙන් හැඳින්විය හැකිය."

- බ්ලන්ට්ෂ්ලි

"නිශ්චිත දේශසීමාවක් තුළ දේශපාලන වශයෙන් සංවිධානය වූ ජනතාව රාජ්‍යයක් ලෙස කෙටියෙන් දැක්විය හැකිය."

- ජීන් බොඩැන්

"පොදු සමාජ හැසිරීම උත්තරීතර බලය සහ තාර්කික බුද්ධිය යොදවා පාලනය කිරීම පිණිස එකට එකතු වූ මිනිස් සමාජය රාජ්‍යය වේ.

## රචනා ප්‍රශ්න

### 01. 1990 - 10

"ස්වාධිපත්‍යය සංකල්පය" පිළිබඳ විචාරාත්මක කෙටි රචනයක් ලියන්න.

### 02. 2003 - 07

පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් තුනක් තෝරා තවදුරටත් පහදා දෙන්න.

1. ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පය යල්පැන ගොස් ඇත.
2. 3. 4. 5.

### 03. 2009 - 03

පහත දැක්වෙන ඒවා සාකච්ඡා කරන්න.

1. ස්වාධිපති බලය 2. 3.

## බහුවර්ණ ප්‍රශ්න

### 1997 - 13

- පහත ප්‍රශ්නයේ දක්වා ඇති ප්‍රකාශ අතුරින් එකක් හෝ කිහිපයක් නිවැරදි වේ. ඒ අනුව A හා B නිවැරදි නම් 1 ද , B හා C නිවැරදි නම් 2 ද , C හා D නිවැරදි නම් 3 ද D හා A නිවැරදි නම් 4 ද එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් 5 ද තිත් ඉර මත ලකුණු කරන්න.

01. ස්වාධිපතිත්වයේ ගුණාංග අන්තර්ගත ප්‍රකාශය හෝ ප්‍රකාශ හඳුන්වන්න.

A ස්වාධිපතිත්වය යනු මහජන කැමැත්තට පමණක් යටත් වූ බෙදිය නොහැකි, පැවරිය නොහැකි සහ උත්තරීතර වූ බලය වේ.
B රාජ්‍යය සතු බලය ස්වාධිපති සංක්ලපය මගින් විස්තර කෙරේ.
C ජාතික රාජ්‍යයන්ගේ නැගී ඒම සමඟ මෙම සංකල්පය බිහිවිය.
D ජනාධිපති ආණ්ඩුක්‍රමය තුළ ස්වාධිපති බලය ජනාධිපති සතුවේ.

(..........)

## 1998 - 17

02. ස්වාධිපත්‍යය ගැන පහතින් සඳහන් වන ප්‍රකාශයන්ගෙන් එකක කතෘත්වය දක්වා ඇත්තේ සාවද්‍යය ලෙසය. එයට අදාළ අංකය හඳුන්වන්න.

1. "එය පුරවැසියන් හා යටත් වැසියන් කෙරෙහි යෙදවිය හැකි නීතියකින් සීමා නොවූ උත්තරීතර බලය යි" - බොඩෑන්
2. "නීතිය යනු ස්වාධිපතිගේ ආඥාවයි" - ජෝන් ඔස්ටින්
3. "ස්වාධිපත්‍ය පිළිබඳ සමස්ථ සංකල්පයම අත්හැර දැමීම දේශපාලන විද්‍යාවට නිත්‍ය ලෙසම ප්‍රයෝජනවත් වනු ඇත." - හැරල්ඩ් ලැස්කි
4. "ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක නෛතික ස්වාධිපති දේශපාලන ස්වාධිපතිට යටත් වේ." - ජෝන් ඔස්ටින්

## 1998 - 06

03. ස්වාධිපත්‍යට අදාළව නිවැරදි නොවන්නේ කුමන ප්‍රකාශයදැයි හඳුන්වන්න.

1. සියල්ලට අණ දෙන එහෙත් කිසිවෙකුගේ අණ නොලබන බලය යි.
2. එය අසහාය වේ, අභෙජ්‍යය වේ , පැවරිය හැකි නොවේ.
3. එය සමාජයේ පවත්නා චාරිත්‍ර සහ නීතිවලට පමණක් යටත් වේ.
4. නිශ්චිත ප්‍රදේශයක් තුළ එය උත්තරීතර ය.

## 2000 - 20

04. ස්වාධිපත්‍ය පිළිබඳ ජෝන් ඔස්ටින්ගේ න්‍යායට අදාළ ප්‍රකාශ කාණ්ඩය හඳුන්වන්න.

A - සෑම සමාජයකම නිශ්චිතව හඳුනාගත හැකි ස්වාධිපතියෙකු සිටී.
B - ස්වාධිපති පුද්ගලයෙකු හෝ පුද්ගල සමූහයක් විය හැක.
C - නෛයිතික ස්වාධිපති බලය රජු වෙත ද දේශපාලන ස්වාධිපති බලය පාර්ලිමේන්තුව වෙත ද පවතී.
D - ස්වාධිපති පුරුද්දෙන් ඇති කරගත් අවනතභාවයක් අඛණ්ඩව සමාජයේ බහුතරයෙන් ලබයි.

1. ABC 2. BCD 3. CDA 4. DAB

## 2001 - 13

05. ස්වාධිපති න්‍යාය කෙරෙහි අදාළ නොවන ප්‍රකාශ තෝරන්න.

1. එය රාජ්‍යයේ බලය පිළිබඳ විස්තර කෙරෙන න්‍යාය කි.
2. එය අසහාය, ඒකීය , බෙදිය නොහැකි සහ පැවරිය නොහැකි දෙයක් වේ.
3. කුඩා රාජ්‍යයන්ට වඩා වැඩි ස්වාධිපති බලයක් විශාල රාජ්‍යයන් භුක්ති විඳී.
4. ප්‍රමාණය කුමක් වුවද, සියළුම රාජ්‍යයන් භුක්ති විඳින්නේ සමාන ස්වාධිපති බලයක් ය.

## 2002 - 11

06. ස්වාධිපත්‍ය පිළිබඳ සංකල්පයට අදාළ කාණ්ඩය තෝරන්න.

A - ස්වාධිපත්‍යය අසහාය වේ. අභෙජ්‍ය වේ.
B - එය වනාහී පුරවැසියන් හා යටත් වැසියන් කෙරෙහි යෙදවිය හැකි සීමවලින් නොබැඳුන බලය යි.
C - ස්වාධිපති බලය රැඳී ඇත්තේ උසාවි වෙත ය.
D - එය නීතියේ උල්පත වේ.

1. ABC 2. BCD 3. CDA 4. DAB

## 2003 - 20

07. ස්වාධිපත්‍යට අදාළ කාණ්ඩය හඳුන්වන්න.

A - මේ පිළිබඳ සංකල්පය ජාතික රාජ්‍යයේ බලය වර්ධනය කිරීම සාධාරණීකරණය කරයි.
B - බෙදීමෙන් ස්වාධිපත්‍ය විනාශ වේ.
C - සෑම මැතිවරණයක් පාසාම මෙම බලය අතිනත මාරු වේ.
D - නීතියේ උල්පත වේ.

1. ABC 2. BCD 3. CDA 4. DAB

## 2004 - 13

08. ස්වාධිපත්‍ය කෙරෙහි අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - ස්වාධිපත්‍ය වූ කලී රාජ්‍ය සතු උත්තරීතර බලය වේ.
B - අනෙක් සමාජ සංවිධාන වලට වඩා රාජ්‍ය උත්තරීතර බවට පත්කර ඇත්තේ ස්වාධිපත්‍ය මගිනි.
C - රාජ්‍යය පණවන නීති වලට නීත්‍යානුකූල භාවය හිමිවන්නේ ස්වාධිපත්‍ය හේතු කොට ගෙන ය.
D - ස්වාධිපත්‍ය බෙදිය හැකි සහ පැවරිය හැකි දෙය කි.

1. ABC 2. BCD 3. CDA 4. DAB

## 2005 - 18

09. ජීන් බොඩෑන් ඉදිරිපත් කළ ස්වාධිපති සංකල්පයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ජනතාව සතු බලය.
2. ව්‍යවස්ථාදායකය සතු බලය.
3. රාජ්‍ය සතු බලය.
4. සන්ධීය රාජ්‍යයක සන්ධීය ඒකක සතු බලය.

## 2006 - 23

■ **පහත ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙකක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රශ්නය සම්බන්දයෙන් දක්වා ඇති ප්‍රකාශ යුගලට වඩාත් ගැලපෙන්නේ වගුවේ දැක්වෙන 1 , 2 , 3 , 4 යන කවර හැඳින්වීමදැයි දක්වන්න.**

| අංකය | ප්‍රකාශය i | ප්‍රකාශය ii |
|---|---|---|
| 1. | සත්‍ය ය. | සත්‍ය ය. |
| 2. | සත්‍ය ය. | අසත්‍ය ය. |
| 3. | අසත්‍ය ය. | සත්‍ය ය. |
| 4. | අසත්‍ය ය. | අසත්‍ය ය. |

| ප්‍රකාශය i | ප්‍රකාශය ii |
|---|---|
| ස්වාධිපත්‍ය යනු නීතියෙන් සීමා නොවුණු යටත්වැසියන් කෙරහි යෙදවිය හැකි බලය යි. (බොඩෑන්) | ප්‍රායෝගික ක්ෂේත්‍රයේදී ස්වාධිපත්‍ය බලය ව්‍යවස්ථානුකූල වාදය, මහජන ස්වාධිපත්‍ය සංධීය වාදය හා ජාත්‍යන්තර වාදය යනාදියෙන් සීමා වන්නේ ය. |

## 2010 - 18

■ **පහත දැක්වෙන ප්‍රකාශ හතරෙන් තුනක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාලය. අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

11. ස්වාධිපත්‍යය,

A - රාජ්‍යයේ කැපී පෙනෙන ලක්ෂණය යි.
B - බාහිර හා අභ්‍යන්තර වශයෙන් පැතිකඩ දෙකක් ඇත.
C - පරමය , සුවිශේෂ බෙදිය හැකි සහ පැවරිය හැකි ය.
D - අන්‍ය සංවිධාන , රාජ්‍යයෙන් වෙන් කර දක්වයි.

1. ABC
2. BCD
3. CDA
4. DAB

## 2011 - 21

12. ස්වාධිපත්‍යට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

    1. - එය රාජ්‍යයේ අත්‍යවශ්‍ය මූලිකාංග වලින් එකකි.
    2. - ස්වාධිපත්‍ය යෙදුම ප්‍රථමයෙන් හඳුන්වා දුන්නේ නිකලෝ මැකියාවේලි ය.
    3. - එය අසහාය සහ අසීමිත වේ.
    4. - එය පුද්ගලයින් සහ පුද්ගල කණ්ඩායම් වලට ඉහළින් පවතින උත්තරීතර බලය යි.

## 2012 - 07 (පැරණි)

■ **නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

13. ස්වාධිපතිත්වය ,

    A - රාජ්‍ය සතු උත්තරීතර බලය වේ.
    B - අසහාය , බෙදිය නොහැකි , පැවරිය නොහැකි සහ ඒකීය දෙයක් වේ.
    C - රාජ්‍යයේ සංයුතික සාධක අතුරින් ඉතාම වැදගත් සාධකය වේ.
    D - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා අවශ්‍යම කොන්දේසියක් වේ.

    1. ABC    2. BCD    3. CDA    4. DAB

# 3.2 රාජ්‍යයේ ආරම්භය හා විකාශනය

# රාජ්‍යයේ ආරම්භය හා විකාශනය

හැඳින්වීම

රාජ්‍යයේ ආරම්භය සහ විකාශනය යන කථිකාව සම්බන්දයෙන් අවධානය යොමු කිරීමේදී මූලිකව මතක තබා ගත යුත්තේ රාජ්‍යයේ ප්‍රභවය කවදා කොතැනකදී කෙසේ සිදුවූයේ දැයි නිශ්චිතව සටහන් තැබීමට නොහැකි බවයි. නමුත් අතීතයේ මිනිසුන් ගත කළ වනචාරී ජීවන රටාවෙන් මිදී ශීලාචාර ජීවිතයකට හුරු පුරුදු වීමෙන් අනතුරුව ස්වකීය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා රාජ්‍ය නැමති සංවිධානය පිහිටුවාගත් බව දේශපාලන විද්‍යාඥයින්ගේ මතය වේ. රාජ්‍යය මෙසේ උත්පාද වන අතර ඉන් අනතුරුව වසර දස දහස් ගණනක් තිස්සේ විකාශනය වෙමින් වර්තමානය තුළ ජාතික රාජ්‍යය නමින් සංධිස්ථානයක ස්ථානගතව පවතී.

- **රාජ්‍යය නිර්මාණය වීමට අදාළ තත්ත්වයන් <u>දාර්ශනික මතවාදයන්ට</u> අනුව ,**

<u>"ප්ලේටෝ"</u> නම් ග්‍රීක දාර්ශනිකයා විසින් <u>"සමූහාණ්ඩුව"</u> කෘතිය තුළ මිනිසුන් රාජ්‍ය නිර්මාණය කර ගැනීමට බලපෑ හේතු **තුනක්** දක්වයි.

01. **භෞතික අවශ්‍යතා** - (මිනිසුන්ට ජීවත්වීම සඳහා අවශ්‍ය ආහාර පාන , ඇඳුම් පැළඳුම් , නිවාස වැනි දෑ )

02. **වාර්ගික සුරක්ෂිතතාවය** - (ස්වකීය වර්ගයේ ආරක්ෂාව හෙවත් පැවැත්ම තහවුරු කරගැනීම.)

03. **පොදු පාලන ක්‍රමයක් නිර්මාණය කිරීම**

<u>"ඇරිස්ටෝටල්"</u> නම් ග්‍රීක දාර්ශනිකයා විසින් <u>"දේශපාලනය"</u> කෘතිය තුළ මිනිසුන් රාජ්‍ය නිර්මාණය කර ගැනීමට බලපෑ හේතු **දෙකක්** දක්වයි.

01. **ආර්ථික අවශ්‍යතාවයන්**

02. **වාර්ගික සුරක්ෂිතතාවය**

- **නූතන ජාතික රාජ්‍යය දක්වා රාජ්‍ය විකාශනය වූ අවස්ථා ,**

**ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමය**
**රෝම අධිරාජ්‍යය**
**වැඩවසම් රාජ්‍යය**
**ජාතික රාජ්‍යය**

● **යුරෝපා දේශපාලන චින්තනයට අදාළ යුග ඔස්සේ රාජ්‍යය විකාශනය වූ ආකාරය**

| යුරෝපා දේශපාලන චින්තනයට අදාල යුග | ඒ තුළ ක්‍රියාත්මක වූ රාජ්‍ය ක්‍රමය |
|---|---|
| ග්‍රීක යුගය<br>රෝම යුගය<br>මධ්‍යතන යුගය<br>නූතන යුගය | පෞර රාජ්‍යය<br>වැඩවසම් රාජ්‍යය<br>වැඩවසම් රාජ්‍යය<br>ජාතික රාජ්‍යය |

■ ග්‍රීක අවධිය සහ පෞර රාජ්‍ය ක්‍රමය

හැඳින්වීම.

ක්‍රි.පූ. 4 , 3 , 2 කාලය ග්‍රීක අවධියට අදාළ කාල පරාසය ලෙස දළ වශයෙන් හඳුනාගත හැකි ය. ග්‍රීසියේ පැවති රාජ්‍ය ක්‍රමය නගර රාජ්‍ය (පෞර රාජ්‍යය) ලෙස නාම කරණය කළ අතර එයට හේතු වූයේ නගර කේන්ද්‍ර කොට ගෙන පාලන කටයුතු සිදු කිරීමයි. නගර රාජ්‍ය හැඳින්වීම සඳහා භාවිතා කළ ඉංග්‍රීසි භාෂාමය පදය වන්නේ Polis ය. එහි සංකේතික අර්ථය වන්නේ නගර පාලනය යි.

පෞර රාජ්‍යයන්ට අදාළ නිදර්ශන

ඇතැන්ස් - ස්පාටා - තීබ්ස් - ක්‍රීට් - ග්ලෝරි - රෝමය - කොරින්ත් ආදී වශයෙන් පෞර රාජ්‍යයන් 158 කට ආසන්න සංඛ්‍යාවක් පැවති බව ඇරිස්ටෝටල් විසින් ස්වකීය **"දේශපාලනය"** කෘතිය තුළ ලේඛන ගත කර ඇත.

පෞර රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණ

1. ආණ්ඩුවේ කාර්යයන් විධිමත්ව බෙදා නොතිබීම.
2. නගර කේන්ද්‍ර කොටගෙන පාලන කටයුතු සිදු කිරීම.
3. ආගම හා දේශපාලනය අතර වෙනසක් නොතිබීම.
4. රාජ්‍යය යනු පුළුල් කරන ලද මිනිස් ආත්මයක් යැයි විශ්වාස කිරීම.
5. රාජ්‍යය අයිතිවාසිකම් හා පුරවැසි අයිතිවාසිකම් අතර වෙනසක් නොතිබීම.
6. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර වෙනසක් නොතිබීම.
7. සෑම නගර රාජ්‍යයක්ම දෙවියන්ට කැප කිරීම සහ දෙවියන්ගේ නම් යොදා තිබීම.

පෞර රාජ්‍යය (නගර රාජ්‍ය) නිර්මාණයට අදාල හේතු

1. **භූගෝලීය සාධකය**

ග්‍රීසිය රළු පරළු කඳු වැටි වලින් ග්‍රහණය සෑම අතටම විහිදී ගිය මෙම කඳු වැටි නිසා ප්‍රධාන ගොඩබිම මිටියාවත් සිය ගණනකට බෙදී පැවතුණි. එක් එක් ගෝත්‍රික ජන කොටස් විසින් මෙම එක් එක් මිටියාවත් ස්වකීය වාසස්ථාන බවට පත් කර ගත් අතර භූගෝලීය ලෙස

පැවැති විශමතාවය නිසා අනික් මිටියාවත් වල ගෝත්‍ර සමඟ සම්බන්ධතා පැවැත්වීමට අපහසු විය. ඒ හරහා එම මිටියාවත් හුදෙකලා වීම.

2. **මිටියාවත් වල ජීවත් වූ ජනතාව අතර පැවැති ස්වාධීනත්වය**

එකිනෙකට තරගකාරී වූ සහ ස්වාධීන ස්වෛරී වූ මෙම මිටියාවත් වල ගෝත්‍රික ජනයා ස්වකීය ස්වාධීනත්වය දීර්ඝ කාලීනව පවත්වා ගෙන යෑම හරහා ග්‍රීසිය තුළ තව දුරටත් පෞර රාජ්‍ය ක්‍රමය වර්ධනයට හා ආරක්ෂාවට අදාළ තත්ත්වයන් නිර්මාණය විය.

<u>ග්‍රීක නාගරික රාජ්‍යයේ පුරවැසිභාවය</u> (Citizenship)

ග්‍රීසියේ වහල් ක්‍රමයක් ක්‍රියාත්මක වූ නිසා පුරවැසි භාවය වහළුන්ටත් - ස්ත්‍රීන්ටත් - විදේශීය වෙළෙඳුන්ටත් - ළමයින්ටත් හිමි නොවූ අතර සමාජ වරප්‍රසාදයන් ද ඔවුන්ට කප්පාදු කරනු ලැබීය. විශේෂයෙන් දේශපාලන කටයුතු වලට සහභාගීවීමට ඔවුන්ට අවස්ථාව හිමි නොවී ය. පෞර රාජ්‍ය තුළ පුරවැසිභාවය හිමිවූයේ රදළයන්ට සහ වහල් හිමියන්ට පමණි.

<u>ග්‍රීක නාගරික රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම</u>

ආරම්භක අවස්ථාවේදී සියලුම නගර රාජ්‍යයන් තුළ පැවැතියේ සහ ක්‍රියාත්මක වූයේ <u>රාජාණ්ඩු පාලන ක්‍රමයකි.</u> සෑම රජෙකුම එම පාලන කටයුතු සඳහා ප්‍රභූන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක සහාය ඇතිව සිය පාලන කටයුතු සිදු කළේ ය. නමුත් විශේෂ හේතු සාධක නිසා රජු ප්‍රමුඛ ප්‍රභූ මණ්ඩලය විසින් සිදු කරගෙන ගිය පාලන ක්‍රමය ජනප්‍රිය වූයේ නැත. එම නිසා විවිධ පෞර රාජ්‍යයන් තුළ එනිනෙකට වෙනස් පාලන ක්‍රම නිර්මාණය වීම හඳුනාගත හැකි ය. <u>ඊට අදාළව,</u>

1. **සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය.**

ජනතාව සෘජුවේම පාලන කටයුතු වලට සම්බන්ධ වන මෙම ක්‍රමය ප්‍රධාන වශයෙන් <u>ඓතිහාසික ඇතැන්ස් පෞර රාජ්‍යය</u> තුළ ක්‍රියාත්මක විය. නමුත් මෙම පාලන කටයුතු වලට සම්බන්ධවීමේ හැකියාව ලැබුණේ පුරවැසිභාවය හිමි පුරවැසියන්ට පමණක් විය. මෙය **ඇතීනියන් ප්‍රජාතන්ත්‍රවාදය** ලෙස ද හඳුන්වයි.

2. **ප්‍රභූ පාලන ක්‍රමය.**

ප්‍රභූන් කිහිප දෙනෙකු විසින් සිදු කරන පාලන ක්‍රමය ප්‍රභූ පාලන ක්‍රමය ලෙස හැඳින්විය හැකිය. <u>ස්පාටා පෞර රාජ්‍ය</u> මීට අදාලව සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශනයකි. ස්පාටාව විශාලම පෞර රාජ්‍ය වූ බවත් එහි සමාජය තුළ ප්‍රධාන ස්ථර (පන්ති) තුනක් පැවැති බවත් සඳහන් වේ.



මෙම සමාජය තුළ වරප්‍රසාද හිමි වූයේ ප්‍රභූන්ට පමණි. එම නිසා නිරන්තරයෙන් වහළුන්ගේ කැරලි ඇති වන්නට විය. මින් ආරක්‍ෂාවීම සඳහා ප්‍රභූන්ට යුද පුහුණුවක් ද ලබාදෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ස්පාටාව යුධමය රාජ්‍යයක් බවට පත් විය.

3. **ඒකාධිපති පාලන ක්‍රමය.**

සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ප්‍රභූ පාලනයන්ට අමතරව ඇතැම් පෞර රාජ්‍යයන් තුළ ඒකාධිපති පාලන ක්‍රමයන් ද ක්‍රියාත්මක වූ බවද ඓතිහාසික ග්‍රීක ලියවිලි තුළ දක්නට ලැබේ.

පෞර රාජ්‍ය ක්‍රමය ක්‍රියාත්මක වූ ග්‍රීක යුගය සම්භාව්‍ය යුගයක් වේ. දර්ශනය , අධ්‍යාපනය , සාහිත්‍යය , විද්‍යාව , සංගීතය , කලාව , ගණිතය වැනි සෑම අංශයකම ප්‍රබෝධයක් හා නවෝදයක් පැවැති අවධියක් ලෙස ග්‍රීක අවධිය හඳුනාගත හැකිය. එම නිසා එය සම්භාව්‍ය අවධියක් ලෙස යුරෝපා දේශපාලන ඉතිහාසය තුළ සඳහන් වෙයි.

පසුකාලීනව ග්‍රීක පෞර රාජ්‍ය බිඳ වැටෙන අතර ඊට බලපෑ හේතු

1. පෞර රාජ්‍ය වල ජනගහනය වැඩිවීම.
2. දූෂිත සහ අක්‍රමවත් පාලන ක්‍රම ගොඩනැගීම.
3. පෞර රාජ්‍යයන් අතර ඇති වූ සන්නද්ධ ගැටුම් හරහා ප්‍රබල බලවත් රාජ්‍යයන්ට කුඩා දුබල රාජ්‍යයන් ගොදුරු වීම. (මත්ස්‍ය න්‍යාය)
4. විදේශීය ආක්‍රමණ
5. රාජ්‍ය බලය අල්ලා ගැනීම සඳහා විවිධ කල්ලි (කැරලි කරුවන්) සූදානම් වීම
6. මැසිඩෝනියානු සහ රෝම අධිරාජ්‍යයේ ආක්‍රමන වලට ග්‍රීක පෞර රාජ්‍යයන් යටත්වීම.

■ රෝම සහ මධ්‍යතන අවධීන්හි පැවැති වැඩවසම් රාජ්‍ය ක්‍රමය

මධ්‍යතන අවධියට අදාළ කාලය හඳුනා ගැනීම.

ක්‍රි.ව 5 - 15 මධ්‍යතන යුගයට අදාළ කාල පරිච්ඡේදය ලෙස යුරෝපා ඉතිහාසයේ සටහන් වෙයි. වෙනත් ආකාරයකින් මධ්‍යතන අවධියට අදාළ කාලපරිච්ඡේදය දක්වන්නේ නම් , රෝම අධිරාජ්‍යය බිඳවැටීමේ සිට ඇමරිකාව සොයාගැනීම දක්වා අතර අවුරුදු 1000 ක කාලය මීට අදාළ වේ. **මධ්‍යතන අවධිය ප්‍රධාන අවධීන් තුනකට ඛණ්ඩනය කළ හැකි ය.**

1. ප්‍රාථමික මධ්‍යතන අවධිය (5 වන සියවස - 11 වන සියවස දක්වා කාලය)
2. උච්ච මධ්‍යතන අවධිය (11 වන සියවස - 13 වන සියවස දක්වා කාලය)
3. පශ්චාත් මධ්‍යතන අවධිය (13 වන සියවස - 15 වන සියවස දක්වා)

මධ්‍යතන අවධිය තුළ ක්‍රියාත්මක වූ රාජ්‍ය ක්‍රමය කුමක්දැයි හඳුනාගැනීම.

මධ්‍යතන අවධිය තුළ පැවති රාජ්‍ය ක්‍රමය වන්නේ **වැඩවසම් රාජ්‍ය ක්‍රමය යි.**

වැඩවසම් ක්‍රමය අර්ථ නිරූපණය

වැඩවසම් ක්‍රමය යනු කුමක්දැයි හඳුනා ගැනීම සඳහා වැඩවසම් ක්‍රමය සම්බන්ධයෙන් පලවී ඇති පොදු නිර්වචන හා දාර්ශනික නිර්වචන භාවිතා කළ හැකිය.

පොදු නිර්වචනය

**වැඩවසම් ක්‍රමය යනු ,ඉඩම් භුක්තිය සහ ඒ වෙනුවෙන් සේවය සැපයීම පදනම් කොටගත් දේශපාලන , සමාජ , ආර්ථි මෙන්ම සංස්කෘතික සංවිධානයක් ලෙස විග්‍රහ කළ හැකි ය.**

දාර්ශනික නිර්වචන

**"වැඩවසම් ක්‍රමය, රජුගේ සිට සමාජයේ පහළම මට්ටමේ පුරවැසියන් දක්වා සියළු දෙනාම ඉඩම් භුක්තිය වෙනුවෙන් ඉටුකරනු ලබන වගකීම් සමුදායකින් එකට බැඳී පවතින සමාජ සංවිධානයක් ය."**
**(ස්ටබ්ස් - Stabs)**

**"වැඩවසම් ක්‍රමය යනු පීතෘ මූලික අධිකාරිය කි."**
**(මැක්ස් වෙබර්)**

- **වැඩවසම් රාජ්‍ය ක්‍රමය**

ප්‍රවේණිය හා බැඳුනු දේශපාලන , සාමාජ , ආර්ථික හා ආගමික ආදී වූ සබඳතා මාර්ගයෙන් සමාජයේ සෑම පුද්ගලයෙකුම කුමන හෝ ප්‍රධානියෙකුට යටත්ව සිටීම දක්නට ලැබුණි.

වැඩවසම් රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණ

1. **බලය විකේන්ද්‍රගත වූ පාලන ක්‍රමය**

   වැඩවසම් රාජ්‍ය පාලන ක්‍රමය තුළ, රජු ⟶ වංශාධිපති නිලකරුවන් ⟶ නයිට්වරු ⟶ ගොවි ජනතාව ආදී වශයෙන් බලය විකේන්ද්‍රගත වූ පාලන ක්‍රමයක් පැවතීම.

2. **රජුගේ බලයට වඩා වංශාධිපති නිලකාර ප්‍රාදේශීය පාලකයන්ගේ බලය වැඩිවීම.**

   වැඩවසම් දේශපාලන ක්‍රමය තුළ රජුගේ බලය ඉක්මවා ගිය විශාල බලයක් වංශාධිපති නිලකාර ප්‍රාදේශීය පාලකයන් සතු විය. **ඊට බලපෑ හේතු ලෙස ,**

- මෙම කාලය තුළ රාජ්‍යය බදු ක්‍රමය ක්‍රියාත්මක නොවූ අතර රජුට ආදායම ලැබුනේ වංශාධිපති නිලකරුවන් දෙන තුටු පඬුරු වලින් පමණක්වීම. **නිසාත්**

- <u>රජුට හමුදාවක් නොවීම,</u> අවශ්‍ය වූ විටදී හේවා පන්න නිලකාරයන් ලබාදෙන හමුදාවක් පමණක් සිටීම. **නිසාත් ,**

- <u>පොදුවේ රට වැසියන් කෙරෙහි බල පැවැත්වෙන නීති පැනවීමට රජුට නොහැකිවීම</u> තමන් යටතේ සිටින වංශාධිපති නිලකාරයන්ට අඥා පැනවීම රජුට කළ හැකි වුව ද නිලකාරයන් යුතුකම් හා වගකීම් ඉටු කළෙත් රජුගේ ආඥාවන් ක්‍රියාත්මක කෙළත් ස්වකීය කැමැත්ත මත පමණක් වීම. **නිසාත්**

මෙවැනි තත්ත්වයක් තුළ <u>වැඩවසම් යුගයේ උච්ච අවධිය</u> වන විට වංශාධිපති නිලකාර ප්‍රාදේශීය පාලකයෝ බෙහෙවින් ස්වාධීනව රජුගේ අණ නොතකා ක්‍රියා කිරීමට හැකි තත්ත්ව නිර්මාණය කාට ගෙන තිබුණි. <u>ඇතැම් විට රජුට වඩා බලවත් වංශාධිපති නිලකාර ප්‍රාදේශීය පාලකයන් දක්නට ලැබුණි.</u>

උදා - ප්‍රංශයේ නොමැන්ඩි ප්‍රදේශයේ වංශාධිපති නිලකාර ප්‍රාදේශී පාලකයා වූ විලියම් 1066 දී එංගලන්තය ජයගෙන එහි රජවී ප්‍රංශ රජුට වඩා විශාල බලයක් රැස්කර ගැනීම.

**තවදුරටත් ,** <u>බිමැනර් නම් 13 වන සියවසේ ප්‍රසිද්ධ ලේඛකයෙකුගේ සමකාලීන දේශපාලන ක්‍රමය විග්‍රහ කරමින් ඉදිරිපත් කොට තිබූ ලියවිල්ල මගින්ද රජුට වඩා වංශාධිපති ප්‍රාදේශිය පාලකයන් බලවත් වූ බව හඳුනාගත හැකිය.</u>

**"සෑම වංශාධිපති නිලකාර ප්‍රදේශිය පාලකයෙක්ම තමන්ගේ ප්‍රාදේශීය ඒකකය තුළ අසහාය පාලකයා වූ බවත් තමන්ගේ යටත් වැසියන් කෙරෙහි අධිකරණ බලයක් පැවැත් වූ බවත් මාර්ග , තොටුපල , වෙරළ , පාලම් ආදී ස්ථාන වල බදු අයකරමින් පුළුල් බදු ක්‍රමයක් ක්‍රියාත්මක කළ බවත් තමාගේ නමින් කාසි නිකුත් කළ බවත් තමා කැමති ඕනෑම කාර්යයකට යෙදවිය හැකි හමුදාවක් පවත්වා ගෙන ගිය බවත් සම්ප්‍රදානුකූලව රජුගේ අධිෂ්වරයට ගරු කළ බවත් ලේඛණ ගත කොට තිබේ."**

3. **ප්‍රවේනිය හා බැඳුනු සමාජ , ආර්ථික හා දේශපාලන සංස්ථාවක් පැවතීම.**

4. **පාලකයින් පත්කිරීම ඉවත්කිරීම සම්බන්ධයෙන් බලතල පාප් වහන්සේට හිමිවීම.**

5. **රාජ්‍යය ශක්තිමත් මධ්‍යම බල අධිකාරියක් යටතේ ගොඩනැගී නොමැති බව.**

6. **ප්‍රාදේශීය මට්ටමේදී පාලනයට අදාල සියලු බලතල එක් පුද්ගලයෙකු වෙත පැවරී තිබෙන පුද්ගල බද්ධ පාලන ක්‍රමය.**

7. **ආර්ථික ක්‍රමය කෘෂිකර්මය මත පදනම්වීම.**

8. **ප්‍රාදේශීය පාලකයන් සතුව පුද්ගලික හමුදා පැවතීම.**

9. **ප්‍රවේණි දාසයන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් සමුදායක් ඉඩම් හිමියා සතු වීම.**

10. **දේවවරම්වාදී දේශපාලන න්‍යාය ක්‍රියාත්ම වීම.**

11. **කිතුනු ධර්මයේත් පල්ලියේත් අධිපත්‍යයක් පැවතීම.**

වැඩවසම් රාජ්‍යය බිඳ වැටීමට අදාළ තත්ත්වයන්

1. **ප්‍රවේණි ක්‍රමය බිඳ වැටීම.**

වැඩවසම් අර්ථ ක්‍රමයේ පදනම වූ ප්‍රවේණිය බිඳ වැටීමට බලපෑ හේතු කිහිපයකි.

■ කුරුස යුද්ධය ■ වෙළඳාම දියුණුවීම. ■ වසංගත මගින් ජනගහනය විනාශවීම.

කුරුසු යුද්ධය නිසා ප්‍රවේණි දාසයන් ඉන් මුදා යුද්ධයට පිටත් කර හැරීම. එසේම යුද්ධ සඳහා ඇදීගිය ප්‍රවේණි දාසයන් නිදහස් මිනිසුන් ලෙස නැවත පැමිණීම. යුද්ධයේදී වංශාධිපති නිලකරුවන් මියගිය විට ඔවුන්ට අයත් ප්‍රවේණි දාසයන් නිදහස් මිනිසුන් බවට පරිවර්තනය වීම. යුද්ධය සඳහා පිටත්ව ගිය පුද්ගලයන් නගරය තුළදී වෙළඳාම ආදියට හුරුවීම ආදිය කුරුස යුද්ධය වැඩවසම් අර්ථ ක්‍රමය බිඳ වැටීමට හේතු කාරක වූ ආකාරයට නිදර්ශන වේ.

2. **වෙළෙඳාම දියුණුවීම හා නගර වර්ධනය**

ප්‍රවේනි ආර්ථිකය බිඳවැටීමත් සමග ඇති වූ අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා වෙළෙඳාම නිර්මාණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස විශාල වෙළෙඳ නගර බිහි විය. වෙළෙඳාම සහ වෙළෙඳ නගර හරහා ඉඩම් භුක්තිය මත පැවැති වැඩවසම් රාජ්‍ය ක්‍රමය බිඳිවැටුනි.

3. **ධනවාදය ආරම්භය හා ව්‍යාප්තිය**

වැඩවසම් ක්‍රමය තුළ "ධනය" (මුදල්) ඒ තරම් වැදගත් සාධකයක් නොවී ය. ඉඩම් භුක්තිය වෙනුවට සේවය සැපයීම, ශ්‍රම හුවමාරු ආර්ථික ක්‍රියාවලියක් පැවැතුනි. නමුත් පශ්චාත් මධ්‍යතන යුගය වන විට මුදල් අත්‍යාවශ්‍ය වන ආර්ථික ක්‍රියාවලියක් සහිත පරිසරයක් ගොඩනැගුනි. එහි ප්‍රතිඵලයක් ලෙස ධනවාදය ආරම්භය හා ව්‍යාප්තිය සිදු විය. එම නිසා වැඩවසම් රාජ්‍ය ක්‍රමය බිඳ වැටුණි.

4. **පුනරුදය (පුනර්ජීවන විප්ලවය)**

පුනරුදය යන්නෙහි සරල අර්ථය යළි පිබිදීමයි. මෙය ගැඹුරින් විග්‍රහකරනු ලබන්නේ නම් ග්‍රීක , රෝම ශිෂ්ටාචාර වල නවෝදය , ප්‍රබෝධය යළි ඇති කර ගැනීමකි. පුනරුදයේ ප්‍රතිඵල ලෙස දේශපාලන , සමාජ , ආර්ථික , ආගමික , සංස්කෘතික , විද්‍යා , තාක්ෂණ , කලාව , සාහිත්‍යය , අධ්‍යාපනය වැනි සෑම ක්ෂේත්‍රයකම දියුණුවක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩවසම් රාජ්‍ය ක්‍රමය බිඳ වැටුණි.

5. **දේශ ගවේෂණය**

1453 දී කොන්ස්තන්තිනෝපලය ඔටෝමන් තුර්කීන් අතට පත්වීම , දේශගවේෂණය සඳහා තුඩුදුන් කේන්ද්‍රීය සංසිද්ධිය ලෙස හඳුනාගත හැකිය. තුර්කීන් (මුස්ලිම්වරු) කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම හරහා යුරෝපීන්ට අවශ්‍ය වෙළඳ ද්‍රව්‍ය ගෙන ඒමට මුහුදු ගමන් ආරම්භ කිරීමට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 15 වැනි සියවස වන විට යුරෝපීන් , ආසියානු , අප්‍රිකානු , ලතින් ඇමරිකානු කලාප තම බලයට යටත්කොට ගෙන

6. **ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණ (ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ)**

ශුද්ධ බයිබලය සහ පල්ලිය ප්‍රශ්න කරමින් විවේචනය කරමින් මාටින් ලූතර් , ජෝන් කැල්වින් වැනි පුද්ගලයන් විසින් සිදු කළ ආගමික ප්‍රතිසංස්කරණය ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණය ලෙස හඳුනාගත හැකිය. මෙම ව්‍යාපාර මගින් යුරෝපය තුළ පල්ලියේ ආධිපත්‍ය බිඳ වැටීමට අදාළ මතවාදය පෝෂණය විය. එය ද වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට අදාළ බලපෑ හේතුවක් විය.

7. **පාප් අධිරාජ්‍යය බිඳ වැටීම**

8. **කාර්මික විප්ලවය.**

ඉහත ආකාරයට මධ්‍යතන යුගය හා එහි ක්‍රියාත්මක වැඩවසම් රාජ්‍යය ක්‍රමය සම්බන්ධයෙන් කිසියම් පුළුල් අවබෝධයක් ලබාත හැකිය.

## ■ නූතන අවධිය තුළ පවතින ජාතික රාජ්‍ය ක්‍රමය

නූතන අවධියට අදාළ කාලය හඳුනා ගැනීම.

15 - 16 වැනි සියවස් නූතන අවධියෙහි ආරම්භක කාල සීමාවන් ලෙස හඳුනාගත හැකිය. මෙම කාලය තුළ මධ්‍යතන යුරෝපයේ පැවැති සංස්ථා සියල්ක්ම පාහේ පරිහානියට පත්වී නූතන සංස්ථා රාශියක් උත්පාවීම හඳුනාගත හැකි විය. නිදර්ශන ලෙස ,

| | | |
|---|---|---|
| ආර්ථික ක්ෂේත්‍රය | ⟶ | ප්‍රවේණි ක්‍රම වෙනුවට වෙළෙඳාම විශාල ලෙස වර්ධනය වූ ධනවාදී අර්ථ ක්‍රමයක් ඇතිවීම. |
| දේශපාලන ක්ෂේත්‍රය | ⟶ | බලතල විකේන්ද්‍රගත වූ වැඩවසම් ක්‍රමය වෙනුවට බලතල සංකේන්ද්‍ය ගත වූ මධ්‍යම ආණ්ඩුවක් සහිත ජාතික රාජ්‍යයන් ගොඩනගා ගැනීම. |
| අධ්‍යාපන ක්ෂේත්‍රය | ⟶ | පූජකයන්ට තිබූ ඒකාධිකාරය අහිමිවීම සහ සාහිත්‍ය සහ කලාකෘති වල ආගමික මුහුණුවර වෙනස්වී ලෞකික මුහුණුවරක් ගැනීම. |

මෙලෙස මධ්‍යතන අවධියේ පැවැති ආර්ථික , දේශපාලන හා සංස්කෘතික යන අංග පර්වර්තනය වූ කාලය නූතන අවධිය ලෙස හඳුනාගත හැකිය.

නූතන අවධිය තුළ ක්‍රියාත්මක වූ රාජ්‍ය ක්‍රමය කුමක්දැයි හඳුනා ගැනීම.

නූතන අවධිය තුළ ක්‍රියාත්මක වූ රජ්‍යය ක්‍රමය **ජාතික රාජ්‍යය** ක්‍රමය ලෙස හඳුනා ගත හැකිය.

● **ජාතික රාජ්‍ය යනු ,**

එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් ය යන න්‍යායාත්මක පදනම මත නිර්මාණය වූ රාජ්‍ය ක්‍රමය ජාතික රාජ්‍යය ලෙස හැඳින්විය හැකිය.

<u>ජාතික රාජ්‍යයන්ට නිදර්ශන</u>

යුරෝපය තුළ <u>එංගලන්තය , ප්‍රංශය</u> ප්‍රථම ජාතික රාජ්‍යයන් ලෙස හඳුනාගත හැකි අතර අනතුරුව ස්පාඤ්ඤය , පෘතුගාලය ද ජාතික රාජ්‍ය ලෙස සංවිධානය විය. පසුව ජර්මනිය , ඉතාලිය ආදීව 20 වන සියවස වන විට ලෝක සිතියම තුළ නූතන ජාතික රාජ්‍යයන් 200 කට ආසන්න ප්‍රමාණයක් සටහන්ව තිබේ.

<u>ජාතික රාජ්‍යය ක්‍රමය නිර්මාණයට අදාළ හේතු</u>

1. වැඩවසම් ක්‍රමය බිඳ වැටීම.
2. ධනවාදය උත්පාද වීම.
3. ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය
4. පුනර්ජීවන විප්ලවය.
5. කාර්මික විප්ලවය
6. වෙළෙඳාම දියුණු වීම.
7. දේශ ගවේෂණය

<u>**තවදුරටත් ,**</u>

- පරිවර්තනීය ක්‍රියාදාමය ,

යුරෝපයේ ඇතිවූ 30 අවුරුදු යුද්ධයෙන් පසුව මිලිටරි බලය (යුද්ධමය ශක්තිය) තුළ අල්ලාගත් ප්‍රදේශ ස්වාධිපති දේශපාලන ඒකක ලෙස ජාත්‍යන්තර පිළිගැනීම සිදුවිය. එය පරිවර්තීය ක්‍රියාදාමය වේ. එයට අදාළ නෛතික පදනම 1648 දී වෙස්ට්ෆෝලියා ගිවිසුම තුළින් සැපයී ය.

- බෙදී වෙන්වීම.

බෙදී වෙන්වීම යනු මහා අධිරාජ්‍යයන්ට යටත්ව තිබූ කුඩා රාජ්‍යයන් ස්වාධීන ඒකක ලෙස බෙදීයාමයි. ඒ හරහා ද ජාතික රාජ්‍යයන් ඇතිවිය. ආසියානු , අප්‍රිකානු , ලතින් ඇමරිකානු කලාප තුළ බිහි වූ නව රාජ්‍යයන් මීට අදාළ නිදසුන් වේ.

- එක්වීම.

වෙන්ව පැවති ප්‍රදේශ එක්ව එක් රාජ්‍යයක් බවට පත්වීම තවත් හේතුවකි. මීට අදාළ නිදසුනක් ලෙස 1776 ඇමරිකානු විප්ලවයෙන් පසු වෙන්ව පැවති ජනපද 13 එක්වී ඇමරිකානු එක්සත්ජනපද රාජ්‍යය නිර්මාණය කරගැනීම.

නූතන ජාතික රාජ්‍යයන් හි ලක්ෂණ ,

1. භූමිය , ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය බලය යන අංග ලක්ෂණ සතරින් යුක්තවීම.

2. එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්ප මත සංවිධානය වීම.

3. මධ්‍යගත පාලනය.

4. වෘත්තීමය නිලබල ක්‍රමයක් මගින් පාලන බලය ක්‍රියාවට නැගීම.

5. අභ්‍යන්තර හා බාහිර කරුණු සම්බන්ධයෙන් ස්වාධිපත්‍ය බලය බුක්ති විඳීම.

ජාතික රාජ්‍ය ක්‍රමයට අදාල මතවාදීමය පදනම පෝෂණය කළ දාර්ශනිකයන්

ජාතික රාජ්‍ය ක්‍රමයට අදාල දේශපාලන මතවාදීමය පෝෂණය නිකලොයි මැකියාවේලි , ජීන් බොඩෑන් , තෝමස් හෝබ්ස් ආදීහු විසින් සපයනු ලැබීය. මැකියාවේලි ස්වකීය "කුමාරයා" කෘතිය හරහා ආගම සහ දේශපාලනය වෙන් කිරීමට ද ජීන් බොඩෑන්ගේ "රාජ්‍ය පිළිබඳ සම්මුතීන් හයක්" යන කෘතිය හරහා ස්වාධිපත්‍ය සංකල්පය හඳුන්වාදෙමින් ද නූතන ජාතික රාජ්‍යයට අදාල මතවාදීමය පෝෂණය ලබාදුනි. ජාතික රාජ්‍යයේ නෛතික පදනම 1648 වෙස්ට්ෆෝලියානු සම්මුතිය මගින් සපයනු ලැබීය.

ජාතික රාජ්‍ය තුළ ක්‍රියාත්මක වූ පාලන ක්‍රමයන්

1. **රාජාණ්ඩු පාලන ක්‍රමය**

ජාතික රාජ්‍ය නිර්මාණය වන මුල් අවස්ථාවේ බොහෝ ජාතික රාජ්‍යයන් තුළ අසහාය බලැති රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවතුනි.

2. **ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය**

රාජාණ්ඩු පාලන ක්‍රමය 1688 ඉංග්‍රීසි විප්ලවයත් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් දක්වා විකාශයනය වන අතර අනතුරුව බොහෝ ජාතික රාජ්‍යයන් තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ක්‍රියාත්මක විය. නමුත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම තුළ ක්‍රියාත්මක වූ ආර්ථික මුහුණුවර කාලානුරූපීව වෙනස් විය. එම නිසා එය ප්‍රධාන අවධීන් තුනකට ඛණ්ඩනය කළ හැකි ය.

**නිර්බාධවාදී රාජ්‍යය**

**සුභසාධන රාජ්‍යය**

**අවම රාජ්‍යය**

- **නිර්බාධවාදී රාජ්‍යය**

<u>නිර්බාදවාදී රාජ්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.</u>

රාජ්‍ය පුද්ගලයාගේ කටයුතු වලින් ඈත්විය යුතුය. පුද්ගලයාගේ කටයුතු වලට බාධා නොකළ යුතුය. පුද්ගලයාට ස්වකීය කටයුතු හුදකලාව සිදුකර ගැනීමට නිදහස තිබිය යුතු යැයි පිළිගත් රාජ්‍යය ක්‍රමය නිර්බාධවාදී රාජ්‍ය ලෙස හඳුනාගත හැකිය. මෙය "පොලිස් " රාජ්‍යය ලෙසද හඳුන්වයි. <u>එසේ හැඳින්වූයේ නීතිය හා සාමය පමණක් සුරැකීම රාජ්‍යයේ කාර්යවූ නිසාය.</u>

<u>නිර්බාධවාදී රාජ්‍යයක දැකගතහැකි ලක්ෂණ</u>

1. රාජ්‍යයේ ප්‍රධාන කාර්යය නීතිය හා සාමය ආරක්ෂා කිරීම පමණක් වීම.
2. ව්‍යවස්ථානුකූලවාදය
3. පුද්ගල වාදය
4. රාජ්‍ය ආර්ථික කටයුතු වලින් මුළු මනින්ම ඈත්වීම.
5. වෙළෙඳ පොළ බලවේග මගින් ආර්ථිකය හැසිරවීම.
6. ආර්ථික කටයුතු මෙහෙයවීම පුද්ගලයා විසින් සිදු කළ යුතුවීම.

<u>නිර්බාධවාදී රාජ්‍යය බිඳ වැටීමට අදාළ හේතු</u>

1. ධනවාදය ආරම්භවීම සහ කාර්මික විප්ලවය
2. ලෝක යුද්ධ අත්දැකීම්
3. මාක්ස්වාදී ව්‍යාපාරයේ ආරම්භය
4. නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමය යටතේ සමාජයේ බහුතර පිරිස අවම වරප්‍රසාද ලැබූ පිරිස බවට පත්වීම.
5. 1928 - 29 වර්ෂ තුළ ලෝකයේ ඇති වූ ආර්ථික අවපාතය
6. නිර්ධන පාංතිකයන් වර්ධනය වීම.

- **සුභසාධන රාජ්‍යය**

<u>සුභසාධන රාජ්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.</u>

රාජ්‍යය , නීතිය සහ සාමය ආරක්ෂා කරනවාට අමතරව අධ්‍යාපන , සෞඛ්‍ය , ප්‍රවාහනය , නිවාස හා යටිතල පහසුකම්, ආපදා කළමණාකරණයට ආදී සෑම අංශයකටම සහභාගී විය යුතු යැයි පිළිගත් රාජ්‍ය ක්‍රමය සුභසාධන රාජ්‍ය ලෙස හඳුනාගත හැකිය. 1928 - 1929 අතර කාලය තුළ ඇති වූ ලෝක ආර්ථික අවපාතය මගින් නිර්බාධවාදී රාජ්‍යය ක්‍රමය සුභසාධන රාජ්‍යය ක්‍රමයක් බවට පරිවර්තනය විය. II වන ලෝක යුද්ධයෙන් පසුව සුභසාධන රාජ්‍ය ක්‍රමය ශක්තිමත් විය. <u>ජෝන් මෙනාඩ් කෙන්ස්ගේ (කෙන්සියානු දර්ශනය)</u> සුබසාධන රාජ්‍යයට අදාළ න්‍යායික පූර්වාදර්ශය විය.

සුභ සාධන රාජ්‍ය සංකල්පය වර්ධනයට බලපෑ හේතු

1. නිර්බාධවාදී රාජ්‍ය යටතේ සමාජ බහුතරය අවම වරප්‍රසාද ලබා සිටි පිරිස වූ නිසා ඔවුන් වෙනුවෙන් රාජ්‍ය මැදිහත් විය යුතු යැයි යන ඉල්ලීම.

2. මාක්ස්වාදී ව්‍යාපාරයේ නැගීම.

3. ලෝක යුද්ධ මගින් සිදු වූ විනාශය සහ ඒවා නැවත ගොඩනැංවීමට රාජ්‍යය සක්‍රීයව දායක විය යුතුය යන ඉල්ලීම.

4. පෞද්ගලික අංශය අඩු අවධානයක් දක්වන හෝ කිසිසේත්ම අවධානය නොදක්වන අංශ සම්බන්ධයෙන් රාජ්‍යය මැදිහත්විය යුතුය යන ඉල්ලීම.

සුබසාධන රාජ්‍ය ක්‍රමයේ ලක්‍ෂණ

1. රාජ්‍ය නීතිය හා සාමය ආරක්‍ෂා කරනවාට අමතරව ආර්ථික , සමාජීය හා දේශපාලන වැනි සෑම අංශයක් සඳහාම මැදිහත්වීම.

2. සමාජ ප්‍රතිසංස්කරණ කාර්යන් ක්‍රියාවට නැගීම.

3. සමාජය තුළ ප්‍රජාතාන්ත්‍රික ලක්‍ෂණයන් බහුලව ක්‍රියාත්මක වීම.
(උදා : නිදහස , අයිතිවාසිකම් , සමානාත්මතාවය , නීතියේ ආධිපත්‍ය හා ව්‍යවස්ථානුකුලවාදය)

4. ආපදා කළමණාකරණය ක්‍රියාත්මක කිරීම.

- **අවම රාජ්‍යය**

අවම රාජ්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.

අඩුවෙන් පාලනය කරනු ලබන රාජ්‍යය අවම රාජ්‍ය ලෙස සරලව හැඳින්විය හැකිය. 1970 දශකය වන විට මෙම රාජ්‍ය ක්‍රමය ලෝකය තුළ වර්ධනය වන ආකාරය හඳුනාගත හැකිය. මෙහි විශේෂ ලක්‍ෂණය වන්නේ රාජ්‍ය කටයුතු වලින් විශේෂයන් ආර්ථික කටයුතු වලින් ඈත්වී කළමණාකරුවෙකුගේ ධූරයට සමාන අයුරින් ක්‍රියාත්මක වීමයි. මිල්ටන් ෆ්‍රීඩ්මන්ගේ ධනවාදය සහ නිදහස යන ආර්ථික දර්ශනය අවම රජ්‍යයට අදාළ න්‍යායික පූර්වාදර්ශය විය. මෙහිදී සැබෑ ලෙසම සිදු වූයේ නිර්බාධවාදී රාජ්‍යයට තරමක් ඉදිරියට ගිය සුබසාධන රාජ්‍යයෙන් පසුපසට පැමිණීමකි.

අවම රාජ්‍යය නිර්මාණයට අදාල හේතු

1. 1970 දශකය පමණ වන විට සුභ සාධන රාජ්‍යය අර්බුධය කරා ගමන් කිරීම.
2. සුභසාධන රාජ්‍ය මහා පරිමාණ ආයෝජකයෙකු ලෙස ක්‍රියාත්මක වුවද එම ආයෝජන අසාර්ථක විම.
3. සුභ සාධන රාජ්‍යයේ අයෝජනය තුළ ක්‍රියාත්මක වූ වංචාව හා දූෂණය.
4. ධනේෂ්වරය හා වාමවාදී කඳවුර අතර පැවැති සීතල යුද්ධය අවසාන වීම.

අවම රාජ්‍යයේ දැකගතහැකි ලක්‍ෂණ

1. පෞද්ගලීකරණය
2. විනිවිදභාවය
3. ප්‍රජාතාන්ත්‍රික ස්වරූපය
4. රාජ්‍ය කළමණාකරුවෙකුගේ භූමිකාවට සමාන ධූරයක් දැරීම.
5. රාජ්‍ය අත්‍යවශ්‍ය සුභසාධන කටයුතු පමණක් සලසන තැනට පත්වීම.

- **III වන ලෝකයේ රාජ්‍යයන් [නව රාජ්‍යයන්]**

නව රාජ්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව යටත් විජිත හරණයත් සමඟ ආසියානු - අප්‍රිකානු - ලතින් ඇමරිකානු කලාප වල නිර්මාණය වූ රාජ්‍යයන් නව රාජ්‍යයන් ලෙස හඳුනාගත හැකිය.

නව රාජ්‍යයන් ට නිදර්ශන

- ආසියානු කලාපය - ලංකාව / ඉන්දියාව.
- ලතින් ඇමරිකානු කලාපය - බ්‍රසීලය/ආර්ජෙන්ටිනාව/චිලී/වෙනිසියුලාව.
- අප්‍රිකානු කලාපය - කෙන්යාව / මොරොක්කෝව / ඝානාව / උගන්ඩාව / නයිජීරියාව .

නව රාජ්‍යයන් හි ලක්‍ෂණ

1. **ආර්ථික ලෙස ඇති දුගී භාවය**

   දූෂණය , නාස්තියරු, වංචාව වැනි දෑ තෙවන ලෝකයේ රාජ්‍යයන් වල ක්‍රියාත්මකවීම හරහා ආර්ථිකමය වශයෙන් දුගීභාවයක් පැවතීම.

2. **දේශපාලනික වශයෙන් ඇති ගතානුගතික භාවය**

   දේශපාලනික ලෙස නවීකරණය නොවීම. බන්ධූත්වය වැනි සරල ප්‍රාථමික කාරණා මත දේශපාලනය ක්‍රියාත්මක වීම. සිවිල් සමාජය තුළ ඇති නූගත් භාවය සහ පවුල් දේශපාලනයක් පැවතීම.

3. **සමාජය තුළ ඇති බහුවිධ ස්වරූපය**

වාර්ගික , ආගමික , වාර්ණික , භාෂාමය , කුලමය ලෙස ඇති වන බහුවිධ භාවය සහ ඒමතින් ඇතිවන ගැටළු වලින් යුක්තවීම.

- **II වන ලෝකයේ රාජ්‍යයන්**

දෙවන ලෝකයේ රාජ්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.

පළමු ලොව රාජ්‍යයන්ට එරෙහිව නිර්මාණය වූ රාජ්‍යයන් විශේෂය දෙවන ලොව රාජ්‍යයන් ලෙස හඳුනාගත හැකිය. වෙනත් ආකාරයකින් නිර්වචනය කරන්නේ නම් ධනේෂ්වර අර්ථ ක්‍රමයක් රැගත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට පසමිතුරුව සමාජවාදී අර්ථ ක්‍රමයක් රැගත් මාක්ස්වාදී දේශපාලන න්‍යාය මත බිහිවූ රාජ්‍යයන් දෙවන ලෝකයේ රාජ්‍යයන් වේ. තවදුරටත් දක්වන්නේ නම් ධනේෂ්වර කඳවුරට පසමිතුරුව නිර්මාණය වන වාමවාදී කඳවුර දෙවන ලෝකයේ රාජ්‍යයන් ලෙස හැඳින්විය හැකිය.

දෙවන ලෝකයේ රාජ්‍යයන් ට නිදර්ශන

සොවියට් රුසියාව (1917) මුල්ම දෙවන ලොව රාජ්‍යය වන අතර ඉන් ඉක්බිති චීනය , කියුබාව , පෝලන්තය , රුමේනියාව , උතුරු කොරියාව ආදී දෙවන ලොව රාජ්‍යයන් රාශියක් බිහිවේ.

දෙවන ලෝකයේ රාජ්‍යයන් බිහිවීමට අදාල හේතු

1. මාක්ස්වාදී චින්තනය රැගත් රාජ්‍යයන් නිර්මාණය කරගැනීමට තිබූ උනන්දුව
2. ධනේෂ්වරය සමඟ නිර්මාණය වූ ධනේෂ්වර කඳවුරට විරුද්ධව වාමවාදී කඳවුරක අවශ්‍යතාවය

දෙවන ලෝකයේ රාජ්‍යයන් හි ලක්ෂණ

1. **රාජ්‍යයේ මූලික අරමුණ වන්නේ විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය උදාකරගැනීම.**
2. **ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වීම. (කොමියුනිස්ට් පක්ෂය)**
3. **ආර්ථික සමානාත්මතාවය තුළින් දේශපාලන සමානාත්මතාවය හා සිවිල් සමානාත්මතාවය ඇති කළ හැකියැයි විශ්වාස කිරීම.**
4. **පුද්ගලයාගේ පෞද්ගලිකත්වය වෙනුවෙන් නොව සමස්ථ සමාජයේම අභිවෘද්ධිය වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම.**
5. **ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට සාපේක්ෂව දේශපාලන, ආර්ථික, සාමාජීය හා ආගමික නිදහස සීමාවකට යටත්ව ක්‍රියාත්මකවීම.**

- **| වන ලෝකයේ රාජ්‍යයන්**

<u>පළමු වන ලෝකයේ රාජ්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.</u>

## බහුවරණ ප්‍රශ්න

**01. 1997 - 03**

නවීන රාජ්‍යය හඳුන්වන ප්‍රකාශයක් වශයෙන් සාවද්‍ය වන්නේ කුමන ප්‍රකාශය දැයි පෙන්වා දෙන්න.

1. රාජ්‍යය සෑදී ඇත්තේ භූමිය, ජනගහනය , ආණ්ඩුව සහ ස්වාධිපත්‍යයෙන් ය.
2. රාජ්‍යයක පැවැත්ම රඳා පවතින්නේ අනෙකුත් රාජ්‍යයන්ගෙන් ලැබෙන පිළිගැනීම මතය.
3. භූමි ප්‍රමාණය , ජනගහනය හෝ ආණ්ඩුක්‍රමයේ ස්වභාවය අතින් වෙනස් වූවද සෑම රාජ්‍යයක්ම සමානය.
4. නූතන රාජ්‍යයට පදනම් වී ඇත්තේ එක් ජාතියක් එක් රාජ්‍යයක් යන මූලධර්මය යි.

**02. 1997 - 04**

ජාතික රාජ්‍යයන්ගේ නැගීම හා සෘජුව සම්බන්ධ නොවන්නේ පහත දැක්වෙන ඒවායින් කුමන සාධකයද?

1. ශුද්ධ රෝමානු අධිරාජ්‍යය බිඳ වැටීම.
2. ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ප්‍රතිසංස්කරණය
3. ස්වාධිපත්‍ය සංකල්පය
4. රජවරුන්ගේ දිව්‍යමය අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය

**03. 1998 - 04**

මුල් කාලීන ජාතික රාජ්‍යයන්ට අදාළ වන ප්‍රකාශ කාණ්ඩය හඳුන්වන්න.

A - එක් ජාතියකට එක් රාජ්‍යයක් බැගින් පැවතීම ඉන් හැඟවේ.
B - වැඩවසම් ක්‍රමයේ බිඳවැටීම එහි නැගී ඒමට පදනම සැපයී ය.
C - රෝමානු කතෝලික පල්ලිය එහි වර්ධනයට උපකාරී විය.
D - බොඩැන්ගේ හා ග්‍රොෂස්ගේ න්‍යායන් එහි පැවැත්ම යුක්ති සගහත කරන්නට දායක විය.

1. ABC 2. BCD 3. CDA 4. BDA

**04. 1999 - 03**

මුල් කාලීන ජාතික රාජ්‍යයට අදාළ නොවන ප්‍රකාශය හඳුන්වන්න.

1. ප්‍රොතතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණය එහි බිහිවීමට පරිසරය සැකසීය.
2. ජාතික රාජ්‍යයන්හි වර්ධනයට රජුන්ගේ බලය හීන වීමට හේතුවිය.
3. ජාතික රාජ්‍යය ගොඩනැංවීමේදී ඒවා තුළ සිටි කුඩා සහ දුබල ජාතීන් යටපත් විය.
4. වානිජවාදය හා ධනවාදය ජාතික රාජ්‍යය ශක්තිමත් වීමට උපකාරී විය.

**05.** **1999 - 08**

රාජ්‍යයේ ස්වභාවය හැඳින්වීමේදී සාවද්‍ය වන ප්‍රකාශය නම් කරන්න.

1. එය සමාජයට පොදු වූ කාරණා ගැන සැලකිලිමත් වේ.
2. එහි සාමාජිකත්වය වෛකල්පිතය.
3. සමාජය තුළ බලය යෙදවීම පිළිබඳ ඒකාධිකාරිය එය සතුවේ.
4. එය සමස්ථ සමාජයටම වලංගු වන ලෙස නීති පනවයි.

**06.** **2000 - 3**

ජාතික රාජ්‍යයට වඩාත්ම අදාළ ප්‍රකාශ හඳුන්වන්න.

1. ජාතික රාජ්‍යය ප්‍රථමයෙන් ම බිහිවූයේ දහවන ශතවර්ෂයේදී ය.
2. ස්වාධිපත්‍ය සංකල්පය නිසා , ජාතික රාජ්‍යය ශක්තිමත් විය.
3. සෑම ජනවාර්ගික කණ්ඩායමකටම විශේෂ වූ රාජ්‍යයක් ඇත.
4. රදළ ආධිපත්‍යය ශක්තිමත් වීමට එය රුකුළක් විය.

**07.** **2001 - 04**

නාගරික රාජ්‍ය ක්‍රමය කෙරෙහි අදාළ වන නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කොට ගෙන ගොඩනැගී තිබුණි.
B - ඒ තුළ වාසය කළ සියළු දෙනාටම දේශපාලන අයිතිවාසිකම් හිමිවිය.
C - දේශපාලන ක්‍රියාදාමයට සහභාගී වීමට ඉඩ ලැබුනේ පුරවැසියන්ට පමණි.
D - ආණ්ඩුවේ වැඩ කටයුතු කාර්යාත්මක වශයෙන් බෙදා නොතිබුණි.

1. ABC 2. ABD 3. BCD 4. ACD

**08.** **2001 - 05**

ජාතික රාජ්‍යයන්ට අදාළ වන නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - භූමිය , ජනගහනය , ආණ්ඩුව සහ ස්වාධිපත්‍යය යන මූලිකාංග මත ගොඩනැගී ඇත.
B - එක්රටක් , එක් ජාතියක් යන මූලධර්මය පදනම් කොටගෙන බිහිවී ඇත.
C - භූමිය , ජනගහනය හා බලය අතින් කුමන වෙනස්කම් පැවතියද ඒවා සියල්ල එක හා සමාන බව පිළිගනී.
D - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය හිමි රාජ්‍යයන් පමණක් ජාතික රාජ්‍යයන් ලෙස සලකනු ලැබේ.

1. ABC 2. ABD 3. BCD 4. ACD

**09. 2002 - 05**

පැරණි ග්‍රීක පෞර රාජ්‍යවලට වලංගු ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - පුරවැසියන් කෙළින්ම රාජ්‍ය පාලන කටයුතු වලට සහභාගී වේ.
B - ගැහැණු , විදේශිකයන් සහ වහලුන් යන අයට පුරවැසිකම නොතිබිණි.
C - මහේස්ත්‍රාත්වරු හා නිලධාරීහු පුරවැසි සභාවලට වගකීමට බැඳී සිටියහ.
D - රාජ්‍යයේ කටයුතු නූතන රාජ්‍යයක මෙන් පැහැදිලිව බෙදා වෙන් කොට තිබිණ.

1. ABC 2. BCD 3. CDA 4. DAB

**10. 2002 - 06**

ජාතික රාජ්‍යයන් බිහිවීමට අදාළ කාණ්ඩය තෝරන්න.

A - කතෝලික පල්ලියේ බලය පිරිහීම.
B - ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය
C - රජවරුන්ගේ දේවවරම්වාදය පිළිබඳ න්‍යාය.
D - වැඩවසම් වාදයේ බිඳවැටීම.

1. ABC 2. BCD 3. CDA 4. DAB

**11. 2003 - 06**

රාජ්‍යයට අදාළ කාණ්ඩය හඳුන්වන්න.

A - එය සමාජයේ පොදු යහපත වෙනුවෙන් පෙනී සිටී
B - රාජ්‍යය නෛතික සමාගමකි.
C - එහි සාමාජිකත්වය කැමතිනම් නොගෙන සිටිය හැක.
D - බල කිරීම පිළිබඳ ඒකාධිකාරය සතු වන්නේ රාජ්‍යයට පමණි.

1. ABC 2. BCD 3. CDA 4. DAB

**12. 2004 - 05**

රාජ්‍යයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - රාජ්‍ය , භූමිය , ජනගහනය , ආණ්ඩුව සහ ස්වාධිපත්‍ය යන අංගයන්ගෙන් සමන්විත වේ.
B - අන් රාජ්‍යයන් සමඟ සටන් කිරීමට මිනිසුන් විසින් රාජ්‍ය ගොඩනගා ඇත.
C - එහි සාමාජිකත්වය අනිවාර්ය වේ.
D - රාජ්‍යයන් ප්‍රමාණය හා බලය අතින් වෙනස් වේ.

1. BCA 2. CDB 3. DBA 4. DCA

**13. 2005 - 04**

ජාතික රාජ්‍යයන්ගේ නැගීඒම කෙරෙහි දායක වූ සාකවලට අයත් නිවැරදි ප්‍රකාශ කාණ්ඩ තෝරන්න.

A - ෆැසිස්ට්වාදයේ නැගී ඒම.
B - ධනවාදයේ නැගී ඒම.
C - ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණවාදයේ නැගී ඒම.
D - වැඩ වසම්වාදයේ බිඳ වැටීම.

1. ABC 2. BCD 3. ACD 4. ABD

**14. 2005 - 05**

රාජ්‍යයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - සියලුම සමාජ සංවිධාන අතුරෙන් උසස්ම සංවිධානයයි.
B - සාමාජිකත්වය ස්වේච්ඡාත්මකයි.
C - භූමිය , ජනගහනය , ආණ්ඩුව සහ ස්වාධිපති බලය යනාදියෙන් සමන්වීමයි.
D - සෑම රාජ්‍යයක් ම තමන්ගේ නිල නාමයකින් හැඳින්වීමයි.

1. ABC 2. BCD 3. ACD 4. ABD

- **15 සහ 16 ප්‍රශ්න වලට ප්‍රශ්නයේ මාතෘකාවට නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.**

**15. 2006 - 04**

"රාජ්‍යය"

1. නිශ්චිත දේශසීමාවක් තුළ දේශපාලන වශයෙන් සංවිධානය වූ ජනතාව
2. සමාජයට පසුව බිහිවූවක් වීම.
3. අනෙක් සමාජ සංවිධාන අතුරෙන් එකක් වීම.
4. ස්වාධිපති බලය හිමි එකම සංවිධානය වීම.

**16. 2007 - 05**

රාජ්‍යය,

1. දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් ප්‍රජාවකි.
2. පුද්ගලයින් හා ඔවුන්ගේ සංවිධාන වලට වඩා උත්තරීතර වන්නේ ය.
3. ආණ්ඩුවේ දේශපාලන හස්තය වන්නේ ය.
4. ස්වාධිපති බලයේ තනි උරුමකරුවා වන්නේ ය.

- අංක 17 සිට 24 දක්වා ප්‍රශ්න වලට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

**17. 2008 - 05**

රාජ්‍ය ,

1. ස්ථාවර භූමියක පදිංචි ජනතාවගේ එකතුවකි.
2. සංවිධානාත්මක ආණ්ඩුවක් මගින් එහි බලය ක්‍රියාවට නංවයි.
3. ජාතිය , සාමාජය , ආණ්ඩුව යනාදිය සමග සමපාත වේ.
4. බාහිර පාලනයකට යටත් නොවේ.

**18. 2008 - 06**

මිනිසුන් විසින් රාජ්‍යය පිහිටුවා ගනු ලැබුයේ ,

1. පොදු යහපත ගොඩනගා ගැනීම උදෙසා ය.
2. නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා ය.
3. විශ්ව සමාජයක් නිර්මාණය කිරීම උදෙසා ය.
4. ජාතික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම උදෙසා ය.

**19. 2008 - 07**

ස්වාධිපත්‍ය ,

1. අසහාය , බෙදිය හැකි , ඒකීය සහ පැවරිය නොහැකි දෙයක් වේ.
2. රාජ්‍යත්වය සංකේතවත් කරන මූලිකාංගය වේ.
3. අනෙක් සමාජ සංවිධාන වලට වඩා රාජ්‍යය උත්තරීතරත්වයට පත් කරන මූලිකාංගය වේ.
4. රාජ්‍යයේ වැදගත් ම සංයුතික සාධකය වේ.

**20. 2009 - 06**

රාජ්‍යය ,

1. අනිවාර්ය නොවූ සාමාජිකත්වයෙන් ගොඩනැගී ඇත.
2. ස්වාධිපති බලය සහිත දේශපාලන ඒකකයක් වේ.
3. දණ්ඩනීය බලය පිළිබඳ ඒකාධිකාරය භුක්ති විඳී.
4. දණ්ඩනීය බලය ක්‍රියාවට නැංවීම පිළිබඳ සදුතභාවය උරුම කරගෙන ඇත.

**21. 2009 - 07**

රාජ්‍යයක ප්‍රධාන දේශපාලන සංකේත වන්නේ ,

1. ජාතික ගීය
2. ජාතික කොඩිය
3. රාජ්‍ය මුද්‍රාව
4. ජාතික අගයන්

## 22. 2010 - 07

ජාතික රාජ්‍ය ක්‍රමය පැන නැගීමට දායක වූ සාධක වන්නේ ,

1. පුනරුද සහ රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය.
2. වැඩවසම් ක්‍රමය බිඳ වැටීම.
3. 16 වන සියවසේදී යුරෝපයේ පැතිර ගිය ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම්
4. යුරෝපය පුරා පැතුරුණු ජාතිකත්ව සංවේදීතා

## 23. 2010 - 08

රාජ්‍යය යනු ,

1. අනෙකතුත් සංවිධාන අතර සුවිශේෂී සංවිධානයකි.
2. ආණ්ඩුවේ උපකරණයකි.
3. අත්‍යාවශය සහ විශ්වීය ආයතනයකි.
4. ස්වාධිපති බලයේ තනි අයිතිකරුය.

## 24. 2011 - 07 (පැරණි)

රාජ්‍යය ,

1. සමාජයට පෙර පැන නැගුණි.
2. දේශපාලන ඒකකය කි.
3. දේශපාලන සමාජය තුළ බලහත්කාරයන් යෙදීමේ ඒකාධිකාරය සතුය.
4. සමාජයේ පවතින අන්‍ය සමාගම් වලට වඩා උත්තරීතරය.

## 25. 2011 - 04 (නව)

නූතන න්‍යායන්ට අනුව රාජ්‍යවල හැඩගැස්ම කෙරෙහි බලපා ඇති සාධක වන්නේ,

A - ත්‍රස්තවාදය
B - ඒකාබද්ධ කිරීම.
C - වෙන්වීම.
D - ජාතිකවාදය
E - පරිවර්තනය

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE

- ප්‍රශ්න අංක 26 සිට 29 තෙක් ප්‍රශ්න වල නිවැරදි ප්‍රකාශය ඇතුළත් කාණ්ඩ තෝරන්න.

**26. 2012 - 03 (නව)**

රාජ්‍ය ,

A - මිනිසුන් විසින් පිහිටුවා ඇති විවිධ සමාජ සංවිධාන අතුරෙන් එකක් පමණි.
B - දුරවබෝධ දෙයකි.
C - ස්පර්ශ කළ නොහැකි හා අදෘශ්‍යමාන දෙයකි.
D - ස්ථාවර දෙයකි.
E - සම්පූර්ණ දෙයකි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

**27. 2012 - 04 ( පැරණි)**

ග්‍රීක නාගරික රාජ්‍යයන්හි පදනම් මූලධර්ම වූයේ ,

A - රාජ්‍යය තුළ ජීවත් වූ සියලු දෙනාටම දේශපාලන බලය හිමි වීම.
B - ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
C - කාර්යාත්මක වශයෙන් බෙදන ලද සමාජය.
D - සීමිත පුරවැසිභාවය.

1. ABCD 2. ABD 3. ACD 4. BCD

**28. 2012 - 05 (පැරණි)**

ජාතික රාජ්‍ය ,

A - රාජ්‍යය ක්‍රමයේ නූතන ප්‍රකාශනය වේ.
B - 15 වන සියවස අවසානයේදී උතුරු ඇමරිකාවේ පැන නැගුණි.
C - භූමිය,ජනගහනය,ආණ්ඩුව හා ස්වාධිපති යන සාධක හතරෙන් සමන්විත වේ.
D - එක ජාතියක් , එක් රටක් යන මූලධර්මය මත ගොඩනැගී ඇත.

1. ABC 2. ABD 3. ACD 4. BCD

**29. 2012 - 06 (පැරණි)**

ජාතික රාජ්‍යයන්හි පැවැත්ම ශක්තිමත් කිරීමට දායක වූ සාධකය වන්නේ ,

A - රාජ්‍යයේ ආරම්භය පිළිබඳ දේවවරම් වාදය
B - ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය.
C - බොඩැන් , මැකියාවේලි සහ හොබ්ස්ගේ දේශපාලන න්‍යාය.
D - 1648 වෙස්ට්පේලියා සාම සම්මුතිය.

1. ABC 2. ABD 3. ACD 4. BCD